M. D. SPENSER ගේ

# THE CURSE IN THE JUNGLE

නවකතාවේ සිංහල අනුවාදනය

# මායා හිස්කබලේ ශාපය..!



සුදර්මන් සතරසිංහ

**M. D. SPENSER** ගේ

THE CURSE IN THE JUNGLE

නවකතාවේ සිංහල පරිවර්තනය

# මායා හිස්කබලේ ශාපය

අනුවාදය

**සුදර්මන් සතරසිංහ**

**මසිත ප්‍රකාශකයෝ**

- දන්කොටුව -



# මායා හිස්කබලේ ශාපය

සුදර්මන් සතරසිංහ


පළමු මුද්‍රණය : 2006

පරිගණක අකුරු සංයෝජනය : රසාදර ධනුෂ්ක - දන්කොටුව.
077-9163116

මුද්‍රණය : ජයන ප්‍රින්ට් - ගනේමුල්ල

බෙදා හැරීම : ඉසිත ප්‍රකාශකයෝ - දන්කොටුව.
031-2258932 / 0777-712748


**සටහනක් !**

"මායා හිස්කබලේ ශාපය"
ප්‍රකට ලේඛක
**M. D. SPENSER** ගේ
**THE CURSE IN THE JUNGLE**
නවකතාවේ
සිංහල පරිවර්තනයයි.

# 01

හැරිගේ මුළු සිරුරම දහඩියෙන් තෙත්ව ඇත.

"අපරාදෙ මම කරගත්තු මෝඩ කමක්."

ඔහු තමාටම කියා ගත්තේය.

දෙමාපියන් සමග කෙටි කාලයක් රැඳී සිටින්නට මේ උෂ්ණාධික වනාන්තර පෙදෙසට හැරි පැමිණ තවම පැය කිපයක්වත් නොමැත. එහෙත් මේ වන විටත් ඔහුට මෙහි වාසය අපුල වී හමාරය.

ඔවුනට පදිංචියට ලැබුණු නිවහනෙහි එතරම් සැප පහසුකම් නොවීය. බිමට දමා තිබෙන සිමෙන්ති ද තැනින් තැන කඩතොළුය. වායු සමීකරණය කර නොමැති එම නිවසෙහි සිවිලිම් පංකා තිබුණද, ඒවා කැරකුණේ මන්දගාමීවය.

මදුරුවෙක් හැරිගේ හිස වටා කැරකුණේය. මොහොතකින් මදුරුවා තම ගෙල පිටුපසට දෂ්ට කරන සෙයක් හැරිට දැනිණ. ඔහු අත්ලෙන් පහරක් ගැසීය. එහෙත් ඒ වෙන විටත් ඔහු ප්‍රමාදය.

මෙම නිවසට පැමිණි පසු අඩුම ගණනේ මදුරුවන් පස් හය දෙනෙකුවත් හැරිට දෂ්ට කර ඇත. මේ විදිහට සතියක් පුරා මදුරුවෝ කී දෙනෙක් තමාගේ ලේ උරා ගනිවිදැයි ඔහු සිතීය.

මේ ගමන ඒමට හැරි නිකමටවත් බලාපොරොත්තු නොවීය. එහෙත් මෙවන් ගමනකට සහභාගි වීමට කැමතිදැයි දෙමාපියන් විමසූ විට ඔහු කැමති වූයේ ඉබේටම මෙනි.

හැරිගේ මව සහ පියා පුරා විද්‍යාව සම්බන්ධව උපාධිධාරීහුය.

හැරිගේ දෙමාපියන්ගේ මිතුරු පුරා විද්‍යාඥයෙකු වනාන්තර පෙදෙස් කැණීම් කටයුතු කරමින් සිටියේය. ඒ ඉන්දියානු මායා නටබුන් පිළිබඳවය. එම නටබුන් තිබුණේ මධ්‍යම ඇමෙරිකාවට අයත් ප්‍රාන්තයක් වන ගෝතමාලාවේ ටිකෝල් පෙදෙසෙහිය.

එම පුරා විද්‍යාඥයා හදිසියේම දැඩි ලෙස රෝගාතුර විය. ප්‍රතිකාර සඳහා ඔහු ආපසු පිටත්ව ගිය පසු එම කැණීම් කටයුතු මෙහෙයවන්නට කෙනෙකු අඩුපාඩු විය.

එය කැණීම් කටයුතු වලට දැඩි බාධාවක් මෙන්ම ගැටළුවක් ද විය. ඒ ටිකෝල් ප්‍රදේශයට මහ වැසි ඇද හැලෙන්නට පෙර කැණීම් කටයුතු නිමා කළයුතු නිසාය. මහ වනය මැද පිහිටි එම නටබුන් පිහිටි පෙදෙසට වැසි වැටෙන්නට පටන් ගත් කළ ඉතාමත් දරුණුය.

එම නිසාම වැසි සමයට පෙර පුරා විද්‍යා කැණීම් කටයුතු කරන්නන් එම ප්‍රදේශයෙන් පිටවිය යුතුය.

රෝගාතුර පුරා විද්‍යාඥයා නික්ම ගිය පසු වැසි සමයට පෙර කැණීම් කටයුතු කරන්නට ඉතිරිව තිබුණේ සති දෙකක පමණ කාලයක් පමණි.

ඒ නිසාම එම කටයුත්ත සඳහා සහභාගි වන්නට සිදුවූයේ හැරිගේ අම්මාට හා තාත්තාටය.

ඒ සඳහා පිටත් වන්නට හැරීගේ දෙමාපියන් කුඩා දියණිය වන වයස අවුරුදු අටක් වූ ලිසා ඇයගේ ආච්චි ළඟ නතර කළහ.

හැරීගේ වයස අවුරුදු 12 කි. ඒ වයසේ පිරිමි ළමයකුට මෙවන් පරිසරයක රැඳී සිටීමටම හැකි යැයි විශ්වාස කළ දෙමාපියෝ ඔහු මෙම ගමනට එකතු කර ගැනීමට තීරණය කළහ. හැරී ද එම ගමනට කැමැත්තෙන්ම එකතු විය.

අලුතින් දකින පුදුමාකාර වනාන්තරයේදී විරල වර්ගවල ගස් සහ සතුන් දැක ගැනීමට තමාට හැකිවේ යැයි හැරී සිතීය. එමෙන්ම තම දෙමාපියන් සහ කැණීම් කටයුතු කරන්නන්



ගොඩගන්නා විවිධ ඇටසැකිලි සහ නටබුන් දැක ගැනීමටද ඔහු තුළ වූයේ දැඩි කැමැත්තකි.

එහෙත් පැමිණ පැය කිහිපයක් ගතවෙන්නටත් පෙර මෙහි පැමිණීමෙන් තමා කළේ මෝඩකමක් යැයි ඔහුට සිතෙන්නට විය. වටපිටාවේ සිටින කිසිම ළමයෙකුට ඉංග්‍රීසි කථා කරන්නට නොහැක. සිනමා ශාලාවක් කිට්ටුවකවත් නොමැත. එපමණක් නොව සුළුවෙන් හෝ තමාට විනෝදවිය හැකි කිසිම දෙයක් දකින්නටවත් නැතැයි ඔහුට සිතිණ.

දෙමාපියන් ළඟ පාත නිවහනක වෙසෙන තවත් පුරා විද්‍යාඥයකු හමුවීමට ගිය මොහොතක හැරී ආලින්දයේ එල්ලෙන ඇඳක වැතිරී පොතක් කියවන්නට විය.

එම පොතෙහි ඇතුලත් වූයේ වසර සිය ගණනකට පෙර ටිකෝල් ප්‍රදේශයේ සහ ඉන්දියානු මායා නටබුන් ප්‍රදේශයේ වාසය කර හදිසියේ අතුරුදහන් වූවකු පිළිබඳ කතාවකි.

පොත කියවීමට හැරී ඇළුම් කළද, දැඩි උෂ්ණය සහ නිරන්තර මදුරු ප්‍රහාරය ඔහුට බාධා කරන්නට විය.

කෙමෙන් හිරු බැස යන්නට විය.

පොත පසෙකින් තැබූ ඔහු මඳ දුරක් ඇවිදින්නට කල්පනා කළේය.

ඔහු නිවහනෙන් පිටව නටබුන් අතරින් ඇවිද යන්නට විය. විනාඩි දහයක පමණ කාලයක් ගත වෙද්දී ඔහු මහෝගනී ගස් බහුලව වැවී ඇති ඉසව්වකට ළගා විය.

තවත් ඉදිරියට ගමන් කළ ඔහුට තමා යන අඩිපාර අසල හුන් ගෙම්බන් දෙදෙනෙකු දක්නට ලැබිණි. කොළ පැහැති එම ගෙම්බන්ගේ ඇස් රතු පැහැතිය. කකුල් නැඹිලි පැහැතිය. හැරී මඳක් නැවතී උන් දෙස බලා සිටින්නට විය.

මුළු වනාන්තරය පුරාම කුරුල්ලන්ගේ කෑ ගැසීම් හඬ පිරී තිබිණ. එම කුරුල්ලන්ගේ හඬ හැරී මෙතෙක් අසා නොතිබුණු අන්දමේ හඬකි. එම හඬ ඔහුගේ සිත මඳක් සසල කරන්නට සමත් විය. දැන් ආපසු හැරී යා යුතු යැයි ඔහුට සිතිණ.

හිසට ඉහළින් නැගුණු කඨෝර හඬත් සමගම හැරි උඩ බැලිය. ඒ හඬ නගා තිබුණේ ඉගිලි යන දිගු හොටයකින් සහ විශාල තටු වලින් යුත් ටවුකාන් කුරුල්ලෙකු විසිනි. ඌගේ පපුව සහ මුහුණ කළු පාට සහ කහ පාටය. ඌගේ නැමුණු දිගු හොටය විවිධ පාටැති දේදුන්නක් සේය.

"ආ....."

හැරිට ඉබේටම කියැවිණ. මෙතෙක් තමා දුටු අලංකාරම පක්ෂියා ඌ යැයි ඔහු සිතිය.

හැරි ආපසු ගමන නතර කර මදකට බිම වාඩි විය. අහර සොයා ඇඳෙන සතුන්ගේ නාදයන් ඔහුට ඇසෙන්නට විය.

තවත් ටවුකාන් කුරුල්ලෙකු ඉගිල ගියේය. ටවුකාන් කුරුල්ලන් හැරෙන්නට ගිරවු වැනි වෙනත් කුරුල්ලන් ගැන හැරිට වගක්වත් නොවිය. ගෙම්බෝ පඳුරු අතරින් පැන පැන ගියහ. කෘමි සත්තු විවිධාකාර හඬවල් නගන්නට වූහ. මේ සියල්ල ඉන්ද්‍රජාලයක් යැයි හැරිට සිතිණ.

"හ.....ර්.....ර්.....වි.....වි......"

එම අමුතු ගෙරවීම් හඬත් සමගම හැරි හුන් තැනින් නැගිට්ටේය.

එය කැලෑවේ වෙසෙන දැවැන්ත බළලකුගේ ගෙරවීමක් බඳු විය. එවැනි අන්දමේ දිවියන් කැලෑවේ වෙසෙන බව හැරිගේ තාත්තා ඔහුට කියා තිබිණ. එම සතුන්ට ඉන්දියානුවන් පවසන්නේ "එක පිම්මෙන් මරා දමන සතුන්" කියා බව හැරිට මතක් විය.

ඒ කැලෑ බළලුන්ගේ බර රාත්තල් දෙසීයකට අධිකය. ඔවුහු වඳුරන්, මුවන්, ගෝනුන් වැන් සතුන් පහසුවෙන්ම මරා ගනිති. ඔවුනට අවුරුදු දොළහක පිරිමි ළමයෙකු බිම හෙළීම ඉතාම පහසු දෙයකි.

හැරි තම ජිවිතය බේරා ගැනීමට තද අන්ධකාරය අතරින් දුවන්නට විය.



# 02

හැරි මලල ක්‍රීඩාවෙහි දක්ෂය. එනිසාම ඔහු වේගයෙන් දුවන්නට විය.

උස් පඳුරුවල කොළ ඔහුගේ මුහුණෙහි වැදිණ. ගස් උඩ සිට පහතට එල්ලී ඇති අඩි විස්සක් පමණ දිගැති වැල් ඔහුගේ සිරුරෙහි පැටලෙන්නට විය.

වෙන වේලාවක නම් හැරිට ටාසන් කෙනෙකු මෙන් එම වැල් වල එල්ලී පැද්දී යා හැක. එහෙත් මෙය එයට අවස්ථාව නොවේ.

අවට ඇත්තේ පුදුමාකාර අන්ධකාරයකි. මේ අඳුරේ තමාට ආපසු යාමට පාර සොයාගත නොහැකි යැයි හැරිට සිතිණ. ඔහු තව දුරටත් අඳුර අතරින් රිංගා යන්නට විය.

මග දිගටම වැල් පටවල්, වැල් මුල් ආදිය ඒ මේ අත ඇදී තිබිණ. හැරි ඒවා ඒ මේ අතට තල්ලු කරමින් මග පාදන්නට උත්සාහ කළේය. එහෙත් එක් මුලක් මගහැර යාමට ඔහුට හැකි නොවිණ. ඒ මුලෙහි පය පැටලුණු ඔහු විසිවී ගොස් ඇද වැටිණ.

හැරි වහා නැගිට ගත්තද තැවරී ඇති මඩ පිසදා ගැනීමට උත්සාහ නොකළේය. ඒ එවන් දෙයකට වැය කිරීමට තරම් කාලයක් නොවූ නිසාය.

ඔහු යළිත් දුවන්නට පටන් ගත්තේය. ඒ අතරතුර හිස හරවා බැලුවේ වන සතෙකු විලිස්සමින් තමා පසුපස හඹා ඒ දැයි බැලීමටය.

ඔහු තවත් වරක් ඇද වැටුණේය. එවර නම් ඔහුට එක්වරම නැගී සිටින්නට නොහැකි විය. ඒ දණ හිස් හා දෙවැලමිට බිම වැදීමෙන් රිදෙන්නට වූ නිසාය. ඔහුගේ ඉහින් කනින් දහඩිය වැගිරෙන්නට වූ අතර පෙනීම ද දුබල වූවාක් සේය.

"මා විනාශයි."

ඔහුට ඉබේටම කියැවිණ.

වැටුණු තැනම ටික වේලාවක් සිටි ඔහුට ඇසෙන්නට වූයේ තම හද ගැහෙන රාවය පමණකි. ඒ හැරෙන්නට ඔහුට ඇසුණේ දුර ඈතක සිට නගන කුරුළු රාවයකි. කැලෑ බල්ලන් තවත් තමන් පසුපස නොඑන්නේ යැයි ඔහුට සිතිණ.

තමා නිරුපද්‍රිත බව වැටහුණු ඔහු නැගිට ගත්තේය. ඔහුගේ සිරුර පුරා ගස්වල අතු වැදීමෙන් ඇතිවූ සීරීම් තිබිණ. දහඩියෙන් කමිසය ඇඟට ඇලී තිබිණ.

ඒ සීරීම් ගැන ඔහුට හැඟීමක් නොවිය. තම ජීවිතයට අනතුරක් නොමැතිවීමේ සතුට එයට හේතුව විය.

"අ__ඊ__රෝ.....ච__ම__"

ඒ ශබ්දයත් සමඟ හැරී යළිත් නිගැස්සිණ.

ශබ්දය නැගුණේ ඔහුගේ හිස හරි කෙළින් ඉහළින්ය. බයටම ඔහුට උඩ බැලිණ.

"ආ...... වඳුරෝ...."

තම හිසට ඉහළින් ගස උඩ සිටින සතුන් හඳුනාගත් හැරිට සැහැල්ලු ස්වරයකින් ඉබේටම කියැවිණ.

හැරිට යළිත් එම වඳුරන්ගේ කෑකෝ ගැසීම ඇසෙන්නට විය.

ඔහු ඒ හඬට බිය නොවිය. වඳුරන් එකිනෙකා අතර අදහස් හුවමාරු කරගන්නේ එවන් ශබ්ද කිරීම් වලින් බව ඔහු දැන සිටියේය.

එහෙත් එම ශබ්දයද දිගින් දිගටම නොඇසුණේය. වඳුරන් ශබ්ද කරනුයේ විටින් විට නිසා එක දිගටම ශබ්දය



නොඇසෙන්නට හේතුව බව ඔහු සිතීය.

ඔහු වඳුරකු දෙස බැලීය. වඳුරාද ඔහු දෙස බලා සිටියේය. වඳුරා තමාට වරිත්තමින් සිටින්නේ යැයි ඔහුට සිතිණ.

මෝඩයෙක් වගේ ක්‍රියා කළ නිසා වඳුරා තමාට සිනාසෙන්නේ යැයි හැරිට සිතිණ.

මෙතෙක් වේලා වේගයෙන් ස්පන්දනය වූ ඔහුගේ හෘද ස්පන්දනය අඩු විය. අඳුර මුළුමනින්ම අරන් ගන්නට පෙර වනාන්තරයෙන් පිටවීමට ඔහුට අවශ්‍ය විය.

තවත් විනාඩි පහක් පමණ ගමන් කරන්ම යළිත් ඔහුට බියක් ඇති විය. ඒ තමා ගමන් කරනුයේ වැරදි පාරක යැයි සිතුණු නිසාය.

ගස් කොළන් බහුලව ඇති නිසා යා යුතු මග නිශ්චිතවම නිර්ණය කිරීමට ඔහුට අපහසු විය.

ටික වේලාවකින් තමා වනාන්තරයට ඇතුළු වූ වැලි පාර ඔහුට දකින්නට ලැබිණ. වැලි පාර මෙන්ම ඒ කෙළවර ඇති තම නිවහන ද ඔහුට පෙනිණ.

අඳුර අතරින් ඔහුට කුස්සියේ දැල්වෙන ආලෝකය දකින්නට ලැබිණ.

අවසානයේදී ඔහු විඩාපත්ව නිවසේ ඉදිරි පඩිපෙළ අසීරුවෙන් මෙන් නගින්නට විය. කෙතරම් වෙහෙසකාරී වුවද දෙමාපියන් සමඟ තම අත්දැකීම් පවසන තුරු ඔහුට ඉස්පාසුවක් නොවිය.

දොර විවෘත කරගත් ඔහු නිවසට ඇතුළු විය.

ඒ සමඟම ඔහු ලතෝනියක් නැගීය.

# 03

හැරිගේ ළතෝතියත් සමගම කුස්සියේ සිටි දෙමාපියෝ නිවසෙහි ඉදිරිපසට දිව ආහ.

හැරි සාලයෙහි සිටගෙන දෙඇස් ලොකු කරගෙන බිම බලාගෙන කෑ ගසමින් හුන්නේය.

කකුල් පහක් ඇති විශාල දිග සර්පයෙක් හිස පහළට ඔසවාගෙන නිසොල්මනේ ගෙබිම තුළ ඇදෙමින් සිටියේය.

හැරි විශ්මිතව බලා සිටියදී සර්පයා වෙත ගිය පියා අහිංසක සතෙකු අල්ලන්නාක් සේ සර්පයා අල්ලා ඔසවා ගත්තේය.

"මේකා විසකුරු සර්පයෙක් නෙවෙයි."

පියා කීවේය.

"මම මේ සතාව අරන් ගිහින් කැලය ළඟට දාලා එන්නම්..."

එසේ පවසමින් පියා නිවසින් පිටව ගියේය.

විනාඩි කිහිපයකට පසු  හැරිගේ පියා ආපසු පැමිණියේය ඔහුගේ අතෙහි සර්පයා නොමැති බව හැරි දුටුවේය.

හැරිගේ පියා වන ක්‍රිස් කෙලර් මහතා උස හීන්දෑරි රැවුල සහ කොණ්ඩය වවාගත් අයෙකි. උපැස් යුවලක් පැළඳ ගත් ඔහු අත්දැකීම් බහුල බුද්ධිමත් මහාචාර්යවරයෙකි.

හැරිගේ මව වන මියුරින් මහත්මිය ආකර්ශනීය පෙනුමකින්



යුත් කාන්තාවකි. ඇයද තම සැමියා මෙන්ම මහාචාර්යවරියකි.

"ආය එහෙම බය විදිහට කෑ ගහන්න එපා."

මව හැරිට කීවාය.

# 04

රාත්‍රී ආහාර වේලාවේදී හැරී තම වීර චාරිකාවේ අත්දැකීම් දෙමාපියන් සමග පැවසීය. දිවියන් යැයි වඳුරන්ට රැවටුණු නිසා තමාට එක වඳුරෙක් හිනැහුණු බව ඔහු තවදුරටත් කීවේය.

එම සිදුවීම වෙන අවස්ථාවේ හැරීට එය බියජනක දෙයක් වුවද දෙමාපියන් සමග පවසන අවස්ථාවේ ඔහුට එය විනෝදජනක දෙයක් විය.

"ඔයාටත් නටබුන් හොයන්න පුළුවන්. කැමති නම් පිරිසක් එක්ක යන්න පුළුවන්. නැතිනම් තනියම වුණත් යන්න පුළුවන්."

අම්මා කීවාය.

ටිකෝල් යනු ජාතික උද්‍යානයකි. හැරීගේ දෙමාපියන් එහි බටහිර කොටසේ කාලයක් තිස්සේ කැණීම් සහ ගවේෂණ කර ඇත. ටිකෝල් හි අනෙක් පැත්තේ ගවේෂණ කටයුතු දැනට කලකට පෙර අවසන් කර තිබ්බා. මේ වන විට එම පෙදෙසට සංචාරකයෝ පැමිණ කඳු නගිමින් නටබුන් නරඹති.

හැරී ඉන්දියානු මායා ප්‍රදේශය ගැන දෙමාපියන්ගෙන් බොහෝ දේ අසා දැන ගත්තේය.

ආදී කාලයේ හුන් මායාවරු ඉතා උගත් ශක්තිමත් ගෝත්‍රික පිරිසකි. එකල දින දර්ශනයක් සහ වේලාව බැලීමේ උපකරණයක් පවා ඔවුන් නිපදවාගෙන ඇත. විශාල බිම් ප්‍රමාණයක් වගා කර ඇති ඔවුහු අති විශාල දේවාල සහ මන්දිර ඉදි කළහ. ඔවුහු චිත්‍ර



ශිල්පයෙහි, තාරකා ශාස්ත්‍රයෙහි සහ විද්‍යාවන්හි නිපුනයින් වූහ. එමෙන්ම ඔවුනට ආවේණික වූ භාෂාවක් සහ ලිවීමේ ක්‍රමයක් තිබ්බා.

ටිකෝල් සහ මායා නගර කැණීම් වලින් සොයාගත් නගරය තුළ පිරමීඩ් ආකාරයට ගලින් කළ විශාල දේවස්ථාන කිහිපයක් ද එම නගරවල සැගව තිබ්බා. තවත් එවැනි පුරාවිද්‍යා වටිනාකම් ඇති දේවල් ඇතැයි විශ්වාස කළද තවම ඒවා සොයාගෙන නැත.

දැනට සොයාගෙන ඇති දේවස්ථාන අඩි දෙසීයකට වඩා උස ඒවාය. එතරම් දිග පළල නැති ප්‍රපාතාකාර පඩිපෙළවල් ඒවායේ ඉහළටම සාදා ඇත. ඒවායේ තැනින් තැන රාජකීය භාණ්ඩ තැන්පත් කළ ගුහාද, රජවරුන්ගේ සොහොන් කුටිද විය.

මෙම දේවස්ථානවලින් වැඩි ප්‍රමාණයක් සොයාගෙන ඇත්තේ ටිකෝල් ප්‍රදේශයෙන් බව හැරී අසා ඇත. එහි ගලින් කළ මන්දිර, ක්‍රීඩා පිටි, මැටි බඳුන්, මැණික්, ඉණිමං ආදී බොහෝමයක් එම ප්‍රදේශයේ තවම සොයාගෙන නොමැතිව පවතින බවද හැරී තම දෙමාපියන් පැවසූ තොරතුරු වලින් වැඩි දුරටත් දැනගෙන ඇත.

"මායා රජවරුන්ගේ ඇටකටු හරි මැණික් හරි තියෙන තැන් වලින් සොලවන අයට අයහපතක් සිදුවෙනවා කියලා පුරාවෘත්තයක් තියෙනවා."

කෑම කන අතර හැරීගේ පියා පැවසීය.

"ඒක ඇත්තක්ද.......?"

හැරී ඇසුවේ අද්භූත ශාපයක් ගැන ඇසීමට ඇති නොකැමැත්තෙනි.

"නැහැ...... කොහෙත්ම නැහැ."

මව එක්වරම පැවසුවාය.

"හොඳයි....... එහෙමනම් කොහොමද ඔය කතාව හැදුණේ......?"

"දැන් ටික කාලෙකට ඉස්සරින් එක පුරා විද්‍යාඥයෙක් මායා රජෙකුගේ ඇටකටු සොයාගත්තා. ඒ අවස්ථාවේ ඔහු ඒ

උස දේවස්ථානයේ මුදුනේ ඉඳන් පහළට වැටිලා මැරිලා තිබුණා. ආයෙ රජෙකුගේ මැණික් ආභරණ සොයාගත් තවත් පුරා විද්‍යාඥයෙක් ඒ දිනයේ සිට ආගිය අතක් නැහැ."

හැරීගේ අම්මා පැහැදිලි කළාය.

"ඔය කතා ඇහෙද්දී මට හිතෙන්නෙ ඒක ශාපයක් කියලයි."

හැරී පැවසුවේ සිතේ නිහැස්සීමකින් යුතුවය.

"ශාප කියලා දෙයක් නැහැ ළමයෝ...,ඒත් ඒවා බොරු කියල බැහැර කරන්නට හැකි විද්‍යාත්මක ක්‍රමයකුත් නැහැ."

පියා පැවසීය.

"ඔයාගෙ මිත්‍ර පුරා විද්‍යාඥයා මෙහෙදී බරපතල විදිහට අසනීප වුණේ කොහොමද..? අසනීප වෙන්න ඉස්සරින් ඔහු මායා රජෙකුගේ ඇට කටු හරි මැණික් හරි හොයා ගත්තාද..?"

හැරී ප්‍රශ්න කළේය.

"ඔව්.. මායා රජෙකුගෙ කියලා සැක කරන්නට හැකි කොටස් වගයක් ඔහු හොයාගෙන තියෙනවා. ඒත් ඔහුගෙ අසනීපයට හේතුව ඒක නෙවෙයි. ඔහුට කෑමක් නරක් වෙලා හරි එහෙම නැතිනම් ලේ වලට විෂ බීජයක් ඇතුල් වෙලා හරි අසනීප වෙන්න ඇති. ඒක හරියටම දැන ගන්න ලැබෙන්නෙ වෛද්‍ය පරීක්ෂණයෙන් පස්සෙයි."

පියා පැවසීය.

රෑ කෑමෙන් අනතුරුව ඔවුන් තිදෙනා විවේක ගැනීමට තම තමන්ගේ කාමර වලට ගියහ.

රාත්‍රී නවයට විදුලි බලය නැතිව විදුලිය නිවුණා. එහෙත් ඒ ගැන හැරීගේ දෙමාපියෝ උනන්දුවක් නොදැක්වූහ.

"ජෙනරේටරය හරියටම රෑ නවයට නතර කරනවා. ආයෙත් නැවත ඒක වැඩ කරන්නට පටන් ගන්නෙ උදේ හයට."

හැරීගේ පියා පැහැදිලි කළේය.

හැරීගේ මව භූමිතෙල් යොදා සකස් කළ ලාම්පුවක් රැගෙන



විත් එය දල්වා හැරීට දුන්නාය.

"ඔයාගෙ නිදන කාමරයෙ ඔයා මේක තියාගන්න."

ඇය කීවාය.

ඉක්මණින්ම පවුලේ අය නින්දට සැරසුණාහ. හැරීගේ දෙමාපියනට පාන්දරම නැගිට කළ යුතු දේවල් සැලසුම් කිරීමට තිබුණා. හැරීටද බැලීමට රූපවාහිනියක්වත් නැති නිසා ඔහුටද සිදුවූයේ කල්වේලා ඇතිව නිදාගන්නටය.

ඔහුගේ නිදන කාමරයෙහි මදුරු දැලකින් කොටු කළ සාමාන්‍ය මට්ටමේ ඇඳක් තිබුණා.

භූමිතෙල් ලාම්පුව ඇඳට තරමක් එපිටින් වූ රඳවනයෙහි රැඳවූ ඔහු ඇඳට ගොඩ වී වැතිරුණේය.

උඩු අතට වැතිර හුන් ඔහුට චිමිනි ලාම්පුවේ ආලෝකයෙන් සිවිලිමෙහි මැවෙන රටා පෙනෙන්නට විය. ඒවා දෙස බලා සිටින ඔහුට තමා වනාන්තරය මැදින් දිව ආ ගමන මෙන්ම මායාවරුන්ගේ ශාපය පිළිබඳ පුරාවෘත්තයද මතක් විය.

විනාඩියක් ගතවන්නටත් පෙර නින්ද ඔහු කරා ළඟා විය.

පැය භාගයකින් පමණ ඔහු හිටි ගමන් අවදි වූයේ තමා සිටින තැන ගැන නිසි අවබෝධයකින් තොරව චංචල වූ මනසකින් යුතුවය.

මකුළු දැලක් මෙන් හිත ඇතුළේ පැටලී තිබූ දෑ ලිහා ගන්නට ඔහුට මඳ වේලාවක් ගත විය. එවිට තමා හදිසියේ අවදි වූයේ කුමන හේතුවක් නිසා දැයි ඔහුට වැටහිණ.

එයට හේතුව නම් කිසිවෙකු ඔහුගේ කාමරයේ ජනෙල් පියනට සෙමින් තට්ටු කිරීමය. කවුරු හෝ කාමරයට ඇතුල් වෙන්නට උත්සාහ කරන්නේ යැයි ඔහුට සිතිණ.

# 05

හැරී ශබ්ද නොනගෙන සේ පා ඇඟිලි තුඩු වලින් ජනේලය කරා ගමන් කළේය.

ඔහු හෙමින් සීරුවේ නිල් පැහැති කපු රෙදි ජනෙල් තිරය තරමක් මෑත් කළේය.

ජීවිත හැම දේම කිසිදු වෙනසක් නැතිව තිබෙන බව ඔහුට වැටහිණ.

හදිසියේම ඔහුට කාමරයට ඇතුළු වන්නට උත්සාහ දරන අය දක්නට ලැබිණ.

ඒ මකුළුවෝය.

මකුළුවන් අඩුම වශයෙන් සියයට අධිකය. සළඹයෝ, කුරුමිණියෝ ආදී තවත් කෘමි සතුන් රැසක්ද සිටියහ.

එයින් සමහර සතුන් ගැන හැරී මින් පෙර අසාවත් තිබුණේ නැත. එක් කුරුමිණි වර්ගයකින් එයෙකුගෙන් විදුලි පන්දම් බැටරියක පමණ බලැති ආලෝකයක් විහිදිණ. එම සත්තු සියළු දෙනාම ජනේලයෙහි වැදෙමින් සිටියහ.

"හ....රී....ප්........ තමිප්..."

හැරීගේ කාමරයේ දැල්වෙන ලාම්පු එළියට ආකර්ෂණය වූ ලෙසින් එම සතුන් උත්සාහ කළේ ඔහුගේ කාමරයට ඇතුල්වීමටය.



ජනෙල් තිර වසා දැමූ හැරී ආපසු ඇඳ කරා ගියේය. ඒ යන අතර ඔහු ලාම්පුවද නිවා දැමීය.

ස්වල්ප මොහොතකින් ජනේලයෙහි කෘමි සතුන් හැප්පෙන හඬ වියැකී ගියේය. හැරී යළිත් නින්දට වැටුණේය.

පසුදා උදෑසන අවදි වූ හැරී දෙමාපියන් සමග එකතු විය.

තිදෙනා එක්ව උදෑසන ආහාරය ගත්හ. අනතුරුව හැරීගේ මව සහ පියා කැණීම් කටයුතු සඳහා යාමට සූදානම් වූහ.

හැරී ද ඔවුන් සමග එක්ව මඳ දුරක් ගමන් කළේය. අනතුරුව ඔහු අතරමගදී මවගෙන් හා පියාගෙන් සමුගෙන වෙනත් මගකට අවතීර්ණ වූයේ තනිවම වනාන්තරය දැක බලා ගැනීමට යාමටය.

හිරු හොඳින් පායා නොතිබිණ. වනයේ එතරම් උණුසුමක් නොවීය. වනාන්තරය අවදිවන හඬ හැරීට ඇසෙන්නට විය. හිරු පිබිදෙනවාත් සමග වන සතුන් ආහාර සොයමින් ගමන් අරඹන බව හැරී දැන සිටියේය.

යෝධ අලංකාර වටුකාන්ලා, දීප්තිමත් කොළ පැහැති ගිරවුන් ගසින් ගසට පියාඹනු ඔහුට දක්නට ලැබිණ. වනාන්තරයේ නාදය තවත් ප්‍රාණවත් විය. කොට්ටෝරුවෙකු දිරාගිය ගසක බෙනයක් හාරනු ඔහුට පෙනිණ.

ඉදිරියෙහි ඇති මල් පඳුරකට වැටී ඇති හිරු එළියෙන් හැරීට වැම්පයර්යෙකු දක්නට ලැබිණ. ඒ සතා ඌරෙකුගේ සහ එළදෙනකුගේ සංකලනයක් බඳුය. මවිල් ගසක්වත් නොමැති ඌගේ ඇඟ අළු පැහැතිය. ඌ කොළ තඩිස්සි වූ එකකි.

මොහොතකින් හැරීට දක්නට ලැබුණේ ඒ අසලම ඇති මඩ වගුරකට පනින වැම්පයරයාය. එම මඩ වගුරෙහි දැගලීමෙන් පසු ඒ වැම්පයරයා පිටතට එනු ඇත්තේ මඩ තවරාගත් ඌරකු මෙන් යැයි හැරීට සිතිණ.

හැරී වනාන්තරයේ මුල් පැය තීපයට ඇළුම් කළේය. මුලින් දුටු සතුන් හැරෙන්නට වෙනත් කිසිම ජීවයෙකු ඔහුට දක්නට නොලැබිණ.

ඔහු දුටු වන පියසෙහි සිටියේ එම සතුන් සහ ඔහු පමණකි. තමන් සතුන් දකින රිසියෙන් ඉදිරියට ගිය ඔහුට කිසියම් ගඳක් ආඝ්‍රාණය විය. එය යමක් දැවෙන විට නික්මෙන කටුක ගඳක් වැනි දෙයකි.

ඒ ගඳ කුමක්දැයි ඔහු කල්පනා කරන්නට විය. මඳ වේලාවකින් එම ගඳට හේතුව ඔහුට සොයාගත හැකිවිය.

පඳුරු අතරින් දිව එන පොකේරියන්ස්ලා දෙදෙනෙකු ඔහුට දක්නට ලැබිණ. උන් වල් ඌරන්ගේ ස්වරූපයෙන් යුත් ගඳ ගසන කැලෑ සතුන් විශේෂයකි. එමෙන්ම ඔවුන් දිවියන්ගේ ප්‍රියතම ආහාරය ද වේ.

පොකේරියන්ස් දෙදෙනා දුවගෙන ආවේ හැරීගේ දකුණු දෙසිනි. එවුන් දිව එන්නේ කෝපයෙන් බව හැරීට පෙනිණ. ඒ සමගම ඔවුන් තමා වෙත කඩා පනින්නට එන බව ඔහුට වැටහිණ.

ආපසු හැරුණු හැරී දුවන්නට පටන් ගත්තේය.

ඔහු වේගයෙන් දිවුවේය. එහෙත් පොකේරියන්ස්ලාගේ තබා ඊමද වේගවත්ය.

සතුන් දෙදෙනා පිඹින හා ගොරවන හඬ ඔහුට ළඟ ළඟින්ම ඇසෙන්නට විය.

හැරීගේ හිත ගැහෙන්නට පටන් ගත්තේය. ගස් මුලක හෝ වැලක පැටලී තමා බිම වැටුණහොත් මෙම දරුණු සතුන් තමා මතට පැන තමාව කිතු කිතු වලට ඉරා මරා දමනු ඇතැයි ඔහුට සිතිණ.

තම හදවත ස්පන්දනය වනුයේ පුපුරා යාමට ආසන්න තරමේ වේගයකින් යැයි හැරීට දැනිණ. එහෙත් ඔහු තව තවත් වේගයෙන් දිවුවේය. පෙරටත් වඩා ආසන්නයෙන් පොකේරියන්ස්ලා පිඹින හඬ ඔහුට ඇසෙන්නට විය.

ඔහු උරහිසට උඩින් පිටුපස බැලීය. පොකේරියන්ස්ලා තව එක විම්මකින් තමා අල්ලාගනු ඇතැයි ඔහුට සිතිණ. ඊට පෙර ඔහු යමක් කළ යුතු විය.



ඒ සමගම ගැලවීමට ඇති එකම මඟක් ඔහුට දක්නට ලැබිණ. එය දිව යන අඩි පාරට නැමී ඇති ගසක අත්තකි. උඩ පැන එහි එල්ලුන හොත් බේරිය හැකි බව හැරී සිතීය.

එම උත්සාහය සාර්ථක වුවහොත් ඔහුගේ ජීවිතය බේරෙනු ඇත. අසාර්ථක වුවහොත් පැණි වලට වග වැටුණු කූඹියන් සේ පොකේරියන්ස්ලා ඔහුට වග වැටෙනු නියතය.

හැකි වෙර යොදා හැරී උඩ පැන්නේය.

# 06

හැරීට යන්තම්න් අත්ත අල්ලා ගැනීමට හැකි විය. ඒ සමග උඩට ඉස්සෙන හැරීට පෙකේරියන්ස් සහතුගේ හොම්බක් තම කකුල යන්තම් වැදෙනු දැනිණ. එය ගණනකට නොගත් හැරී අත්ත දිගේ ගසේ කඳ අසලට ගොස් එතැනින් තවත් ඉහළ අත්තකට නැග එහි හිඳ ගත්තේය.

ගස පාමුල සැවතුණු පෙකේරියන්ස්ලා කෝපාන්විත ඇස් වලින් ඔහු දෙස බලමින් රෞද්‍ර ලෙස ගොරවන්නටත් පිඹින්නටත් විය. ඒ අතරම ගස වටා කැරකෙමින් ඉව අල්ලන්නටද විය.

"මට කොයිතරම් වෙලාවක් මේ උඩට වෙලා ඉන්න වෙයිද....?"

ඔහු තමාටම කොඳුරා ගත්තේය.

ඔහුට යමක් බිඳෙන හඬ ඇසිණ. ඒ සමගම තමා වාඩි වී සිටින අත්ත තරමක් පාත්වෙන බවත් ද දැනිණ. ඔහු හැරී බැලීය. තමාගේ බරට අත්ත බිඳෙන බව ඔහුට වැටහිණ.

අත්ත කැඩී තමාත් සමග බිම පතිත වුවහොත් එය දැඩි අන්තරාවකට පත්වීමක් බව හැරීට සිතිණ. අත්ත නොකැඩේවායි ඔහු ප්‍රාර්ථනා කළේය.

ඔහු පහළ බැලීය. පෙකේරියන්ස්ලා දෙදෙනා තමා දෙස බලමින් ඉව අල්ලමින් ගස මුල සිටින අන්දම ඔහුට පෙනිණ. ඔහුට හුස්ම ගැනීම පවා අපහසු සෙයක් දැනිණ. යළිත් අත්ත තරමක් බිඳෙන හඬ ඇසිණ.



පෙකේරියන්ස්ලා හොම්බු වලින් බිමට අනිමින් පැමිණි මගින්ම ආපසු යන්නට විය. හැරීගේ සිතට යන්තම් සැනසිල්ලක් දැනිණ.

ඔවුන් නොපෙනී ගියාට පසු හැරී ගසෙන් බැසීමට සැරසිණ.

එවිටම බර... බරාස්... හඬ නගමින් අත්ත කැඩී ඔහුත් සමගම බිම පතිත විය.

වාසනාවකට මෙන් හැරීට කිසිදු හානියක් නොවීය. නැගිට වටපිට බැලූ හැරී ඇඟේ තැවරී ඇති පස් පිස දමා ගත්තේය. වනාන්තරයෙන් පිටවී විසෝල් කටමුන් හරා විහිදෙන ප්‍රධාන අඩි පාර දිගේ යාමට ඔහු තීරණය කළේය. මඳ දුරක් ආ ඔහු එළිමහන් ඉසව්වකට ළඟා විය. සංචාරකයින් අට දෙනෙකු සහ මග පෙන්වන්නෙකු මායා දේවාල ඉදිරියෙහි සිටිනු ඔහුට දක්නට ලැබිණ. ඔහු ඒ අය අසලට ගියේය.

වනාන්තරය තුළ ඇති එම ප්‍රධාන එළිමහන් බිම් කඩ හැඳින්වෙනුයේ "ලේට ජලාසා" නමිනි. එහි නැගෙනහිර කෙළවරෙහි අඩි සියයකට වඩා අහස උසට විහිදී ඇති ඉපැරණි දේවාලයක් ඇත. එය හැඳින්වෙනුයේ ප්‍රධාන දිවියාගේ දේවාල නමිනි. එය පසුකර බටහිර දෙසට ගිය විට තරමක් කුඩා තවත් දේවාලයක් ඇත.

සංචාරක මග පෙන්වන්නා විදේශිකයින් හට පවසන තොරතුරු හැරීට ද ඇසිණ. ඔහු පවසන පරිදි මායා රජෙකුගේ ඇටකටු ප්‍රධාන දිවියාගේ දෙවොලෙහි තැන්පත් කර තිබී එය පුරා විද්‍යාඥයෙකු සොයාගෙන ඇත. ඒ සමගම එහි තිබී වටිනා ආභරණ, තොගයක්, මැණික් සහ මුතු තොගයක්ද ඒ පුරා විද්‍යාඥයා ඇතුළු පිරිසට හමුව ඇත.

එම දේවස්ථානයේ ඉහළට නැගීම ඉතාමත්ම අපහසුය. එහි ඉහළට නගිද්දී අඩුම තරමින් දෙදෙනෙකු හෝ පහළට වැටී මිය ගොස් ඇති බව එම සංචාරක මග පෙන්වන්නා පැවසීය.

එම දේවස්ථානයේ ඉහළට නැගීමට හැරීට අවශ්‍ය විය. එහෙත් එහි යටිතල ප්‍රතිසංස්කරණ කටයුතු නිසා මහජනතාවට ඇතුළුවීමට තහනම් කර තිබිණ.

එම දේවස්ථානය පසුකර අනෙක් දේවස්ථානය කරා ගිය හැරී එහි ඉහළට නගින්නට විය.

එහි ගල් පඩි පටු සහ එක එල්ලේ ඉහළට විහිදුනු ඒවා විය. පහළ නොබලමින් ඉහළට නැගිය යුතු යැයි තීරණය කළ හැරී ප්‍රවේශමෙන් පඩියෙන් පඩිය නගින්නට විය.

ඉහළටම නැගුණු ඔහු පාලකයින් පරිහරණය කළ කාමර යැයි සිතිය හැකි කාමර තුළ ඇවිද්දේය.

අනතුරුව දේවස්ථානයේ ඉහළටම නැගි ඔහු එතැන සිට අවට ඇති නටබුන් දෙස බැලිය.

ඔහුට ටිකෝල් ප්‍රදේශය වටකර ඇති මහ වනය දක්නට ලැබිණ.

එම දේවස්ථානයෙන් පහළට බැස ගත් හැරී යළි සංචාරකයින් අතරට එක් විය. දැනට ග්‍රේට් ප්ලාසා හි සිදු කෙරෙන කැණීම් කටයුතු ගැන මග පෙන්වන්නා විසින් සංචාරකයින් හට විස්තර කරනු ඔහුට ඇසිණ.

ඔහුගේ සිතට සියුම් ආඩම්බරයක් දැනිණ. ඒ එම කැණීම් කටයුතු සිදුවෙන්නේ ඔහුගේ පියාගේත් මවගේත් ප්‍රධානත්වයෙන් බැවිනි.

ඒ බව සංචාරකයින් සමග පවසන්නට සිතුණද හැරී එම සිතුවිල්ල ආයාසයෙන් මැඩ ගත්තේය.

ටිකෝල් හි නටබුන් බොහෝමයක් මෙතෙක් ගවේෂණය කර නොමැති බවත් අනෙක් ඒවායේද ගවේෂණ කටයුතු තවම අවසන් නැති බවත් මග පෙන්වන්නා සංචාරකයන්ට පැවසිය.

"මායා රජවරුන්ගේ තවත් සොහොන් මේවායේ තියෙනවා. ඒත් තවම සොයාගෙන නැහැ. ඒ වගේම තවත් අගනා මුතු මැණික් තොගයකුත් ඒ සමගම සොයා ගන්නට පුළුවන් වෙයි කියලා විශ්වාසයකුත් තියෙනවා."

මග පෙන්වන්නා වැඩි දුරටත් පැවසිය.

"ආ..... මටත් හිතෙනවා. මායාවේ පාලකයෙකුගේ ඇට කටු



නැතිනම් අඩුම ගණනෙ එයාගේ මුතු මැණික්වත් හොයා ගන්න."

හැරී තමාටම කියා ගත්තේය.

ඒ සමගම එවන් දෙයක් සඳහා උත්සාහ කළ යුතුය යන අදිටන ඔහුට ඇති විය.

# 07

එදින රාත්‍රී ආහාර මේසයේදී හැරී දෙමාපියන්ගෙන් කටවුන් සහ ඒවා ගවේෂණය කරන අන්දම ගැන විවිධාකාර තොරතුරු විමසීය.

ඒ වනවිට ඔහුගේ මව සහ පියා ටිකෝල් කටවුන් අතරින් පුරාණ ඉවුම් පිහුම් උපකරණ ස්වල්පයක් සොයාගෙන තිබිණ.

ඒ කරුණු වලට සවන් දුන් හැරීට තමාගේ ගවේෂණ කටයුතු සඳහා උල් ආයුධයක් අත්‍යවශ්‍ය බව වැටහිණ.

පසුදින උදයේ ද හැරී සුපුරුදු පරිදි දෙමාපියන් සමගම අවදි විය. එහෙත් පෙරදා මෙන් දෙමාපියන් සමග පිටව නොගිය ඔහු නිවහනෙහි නතර විය.

දෙමාපියන් නිවහනෙන් නික්ම නොපෙනී යනතුරු සිට වහා ක්‍රියාත්මක විය. විදුලි පන්දමක්, අත් වැසුම් යුවලක් සහ හැරුම් උපකරණ කිහිපයකුත් ඔහු තම ගමන් මල්ලට දමා ගත්තේය.

මෙම කැණීම් උපකරණ තම දෙමාපියන් ප්‍රයෝජනයට නොගන්නා අතිරේක ඒවා බව ඔහු දැන සිටියේය. ඔවුහු ආයුධ සහ උපකරණ කැණීම් කටයුතු සඳහා යනවිට ගෙන ගොස් ආපසු ගෙන ඒමට පුරුදුව සිටියහ.

ටික වේලාවකට පසු හැරී ගමන් මල්ලත් රැගෙන කටවුන් ඇති පෙදෙස කරා ගමන් ඇරඹීය. ඒ වෙන විට හිරු නැග එමින් තිබිණ. කුරුල්ලන්ගේ කෑ කෝ ගැසීම් හැරෙන්නට ටිකෝල්



පෙදෙසෙහි වෙනත් කිසිම ශබ්දයක් නොවිය.

තමන්ට වම් පස ගසක් උඩ කිසිවෙකු දඟලන හඬක් හැරීට ඇසිණ. ඔහු උඩ බැලුවේය. මකුළු වඳුරු පවුලක් ගස් අතු මත සෙල්ලම් කරමින් සිටියහ. මෙම මකුළු වඳුරන් අනෙක් වඳුරු වර්ග වලට වඩා ඉතා කුඩා එමෙන්ම අවලස්සනය.

තම ගවේෂණ කටයුතු සඳහා හැරී තැනක් තීරණය කරගෙන සිටියේය. ඒ පෙරදින රැයේ ටිකෝල් ප්‍රදේශය ගැන පියා ලියා තිබූ සටහන් පොතක් කියවීමෙනි. එම පොතේ කරුණු අනුව හැරී තෝරාගෙන සිටි තැන වූයේ "පරිඩියෝ" නම් ස්ථානයයි. එය අයත් වන්නේ ටිකෝල් ප්‍රදේශයේ "සැඟවුණු ලෝකය" යන කොටසටය.

සැඟවුණු ලෝකය ප්‍රදේශයට අමුත්තන් හට ඇතුල්වීම තහනම් කර තිබිණ.

හැරී මෙම කොටසේ කැණීම් කිරීමට තීරණය කළේ මීට පෙර පුරා විද්‍යාඥයින් මෙහි තරමක් කැණීම් කර අත්හැර දමා තිබුණු හෙයිනි. ඔවුන් මෙහි ගවේෂණ කටයුතු නතර කර වෙනත් පෙදෙසක ගවේෂණ කටයුතු සඳහා පිටත්ව ගොස් ඇත.

ඒ අයට මෙහිදී කිසිවක් සොයාගත නොහැකි වූවද ඔවුන් සෑහෙන තරමක් කැණීම් කටයුතු කර තිබිණ. එය හැරීට පහසුවක් විය.

ඒ අය කැණීම් කටයුතු වලින් සොයාගෙන තිබූ එක් පිරමීඩයක් අසලට ගිය හැරී විමසිලිමත්ව එදෙස බැලීය.

මෙහි ගවේෂණ කටයුතුවල යෙදීම තම සිතුවාට වඩා බරපතල එකක් බව ඔහුට හැඟිණ. පිරමීඩය අඩි සියයකට වඩා උසය. බිම මට්ටමේදී එහි පළල අඩි දෙසිය පනහක් පමණ විය. හැරී හෙමින් සීරුවෙන් ලංවේය.

"කොහෙන්ද පටන් ගන්නෙ..... කොහොමද මම මේක කරන්නෙ......?"

ඔහු තමාගෙන්ම ප්‍රශ්න කළේය.

හෙමින් සීරුවේ පිරමීඩය අසලට ඇවිද ගිය හැරී මින් පෙර

හැණීම් සටහුක ගල අය ඇතුළට ගිය බාර්තයන් වෙදැයි පරීක්ෂා කර බැලීය.

එහෙත් එවැනි හැකක් ඔහුට සොයාගත නොහැකි විය.

තව ටික වේලාවක් පරීක්ෂා කිරීමේදී ඔහුට පිරමීඩය ඉහළට විහිදී ඇති ඉතා පැරණි ගල් පඩි පේළි දෙකක් දක්නට ලැබිණ.

ඔහු ඒවායින් එකක් ඔස්සේ නගින්නට පටන් ගත්තේය. එම ගල් පඩි පෙළ දෙව්ල් ප්ලාසා හි පිරමීඩවල ගල් පඩි පේළි තරම් ආරක්ෂා සහිත නොවිණ.

ඔහු නගින්නට වූ ගල්පඩි පේළිය පටු එකක් වූ අතර සමහර තැන්වල ගල් ගැලවී තිබිණ. එනිසාම ඔහුට දෙපා වලට අමතරව දෙඅත් වලින්ද ප්‍රයෝජන ගන්නට සිදුවිය.

පිරමීඩයේ ඉහළට ආසන්නයේදී ඔහු පය තැබූ ගලක් ගැලවී ගිය අතර සමබරතාවය නැතිවිය. අඩි සියයකට ආසන්න උසක සිට පහත ට ඇද නොවැටී ඔහු බේරුණේ ඉහළින් වූ ගල් පඩියක දෙඅතින්ම එල්ලීමෙනි.

ගැලවී ගිය ගල පිරමීඩය පාමුල ඇති ගල් ගොඩවල් මතට ඇද වැටී නැගුණු හඬ මුළු වනාන්තරය පෙදෙස පුරාම දෝංකාර නැගීය.

අසීරු නැගීම නිසා හැරීගේ දෙකකුල් වේදනා දෙන්නට විය. එහෙත් තවත් ගල් පඩි කීපයක් නැගීමෙන් පසු පිරමීඩයේ ඉහළට ගොඩවෙන්නට ඔහුට හැකි විය. ඒ වෙනවිට ඔහුගේ නළලතින් හා පිට දිගේ දහඩිය රූරා හැලෙමින් තිබිණ. දෙඅත් දණ හිස් වලට තද කරගත් ඔහු මොහොතක් වෙහෙස නිවා ගත්තේය.

අනතුරුව කෙළින් සිට ගත් ඔහු සැඟවුණු ලෝකය අවට සිරි නරඹන්නට විය. ගස් කොළන් ආදිය මිසක මිනිස් පුළුටක් වත් දක්නට නොවිය. සැඟවුණු ලෝකයෙන් එහාට නෙත් විහිදූ ඔහුට පිරමීඩ දෙකකට නගින මිනිසුන් කිහිප දෙනෙකු දක්නට ලැබිණ.

හැරී පිරමීඩය තුළට ඇතුළුවිය හැකි මගක් සොයන්නට පටන් ගත්තේය. පිරමීඩය මතුපිට බුරුල් වූ ගල් කැට



අවුල්වෙලුනට විසිර තිබිණ.

බලාපොරොත්තු නසාගත් ඔහු ආපසු නිවහන තරා යාමට සිතාගෙන සිටියදී යම් දෙයක් ඔහුගේ නෙතු ගැටිණ.

ඒ එක් කෙළවරක බිම දැඩි සැරවට ගලකින් වැසුණු බවය. එහෙත තිබූ ගල් ද විශාල ඒවා නොවිය.

හැරී තම අත් වැසුම් යුගල පැළඳගෙන එතැන ඇති ගල් කැට ඉවත් කරමින් බිම හාරන්නට පටන් ගත්තේය. කුඩා ගල් අතින් ඉවත් කරන අතර මහ ගොඩක තරමක ලොකු ගල් ඉවත් කිරීමට ඔහු කරේ එල්ලාගෙන සිටින මල්ලේ ඇති කැණීම් උපකරණ උපයෝගී කර ගත්තේය.

පිරමීඩයේ ඉහළ බිම පහසුවෙන් කැණීමට හැකිවීම ඔහුට පුදුමයක් විය.

ඒ වෙනවිට ඔහු තරමක ප්‍රමාණයක සිදුරක් හාරාගෙන තිබිණ.

මොහොතක විවේකයක් සඳහා ඔහු වැඩ නතර කළේය. හාරු වලට දකුණු දෙසින් සිටගත් ඔහු තමා කළ කාර්යය දෙස උනන්දුවෙන් බලා සිටියේය.

හිටිගමන් ඔහු සිටගෙන සිටි තැන පහතට කඩා වැටිණ.

"ආ...ක්......"

අඳුරු ආගාධයක් වැනි පිරමීඩය ඇතුළට තමා ඇද වැටෙන බවක් හැරීට හැඟිණ.

තමා අඳුරු ආගාධය තුළට ඇද වැටී මිය යාවි යැයි සිතුවිල්ල පමණක් හැරීට ඇති විය.

# 08

"ආ.....හ්......"

තම පිටුපස දෙඅතින්ම පිරිමැද ගනිමින් හැරි නැගිට ගත්තේය.

ඔහු ඇද වැටී තිබුණේ විශාල පිරමීඩය තුළ ඇති තවත් කුඩා පිරමීඩයක් මතටය.

තමා ඇද වැටීමෙන් නැගුණු දූවිලි අතරින් ඔහු උඩ බැලිය. අඩි විස්සක් පමණ ඉහළින් ඇති තමා ඇද වැටුණු කුහරයේ විවරයෙන් ගලා එන මඳ හිරු එළිය ඔහුට දක්නට ලැබිණ.

ඔහු තම ඇඳුම්වල තැවරුණු දූවිලි පිසදමා ගත්තේය. මෙවන් ඇද වැටීමකින් අතක් පයක් නොකැඩී, තුවාලයක් නොවී තරමක රිදීමක් පමණක් ඇතිවීම ගැන හැරි සතුටු විය.

ඔහු සිටින තැන වාතය දූවිලි පිරි එකකි. හැරි තම විදුලි පන්දම අතට ගෙන එය දල්වා වටපිට විපරම් කළේය.

දක්නට ලැබුණු දෙයින් හැරි විශ්මයට පත්විය.

තමා සිටින්නේ පොළොව යට පිහිටි නගරයක බව ඔහුට වැටහිණ. ඔහු සිටින පිරමීඩය හැරෙන්නට එවන් ප්‍රමාණයේ තවත් පිරමීඩ හතරක් අවට තිබිණ. ඒ හැරෙන්නට මායාවරුන් ඉදිකළ කුඩා ගොඩනැගිලි කිපයක්ද, ප්‍රතිමා කිපයක්ද තිබූ අතර තැනින් තැන මැටියෙන් කළ භාජනවල කැබලිද විය.



ඉබේටම මෙතැනට ඇද වැටුණේ නැතිනම් මෙම ස්ථානය තමාට කෙසේවත් සොයාගත නොහැකි බව ඔහු සිතීය. ඒ සමගම මායා රජවරයෙකුගේ ඇටකටු තමාට සොයාගත හැකිවේ යැයි යන විශ්වාසය ඔහු තුළ ඇතිවිය.

මෙම පිරමීඩ වලින් එකක රජ කෙනෙකුගේ සොහොන් ගැබක් වේ නම් එය තිබිය යුත්තේ පිරමීඩ වලින් උසම එක තුළ යැයි හැරි තීරණය කළේය.

ඔහු විදුලි පන්දම් එළිය යොමු කරමින් අනෙක් පිරමීඩ දෙස බැලිය. මෙහි ඇති පිරමීඩ වලින් උසම පිරමීඩය තමා සිටින පිරමීඩය බව ඔහුට වැටහිණ.

ඔහු හෙමින් සීරුවේ පිරමීඩය මත ඇවිදින්නට විය. එහි ගලින් ඉදිකල කාමර තුනක් තිබිණ.

ඔහු මුලින්ම හමුවූ කාමරයට එබී බැලිය. එතුළ කිසිවක් නොවිය.

දෙවැනි කාමරයටද එබී බැලිය. එය ද හිස්ය.

තුන්වැනි කාමරයට ඇතුළුවීම ඔහුට අසිරු දෙයක් විය. ඒ එම කාමරයේ දොරටුව වැසෙන සේ විශාල ගල් සිරකර තිබූ නිසාය.

වසා ඇති මෙම කාමරය තුළ කුමන හෝ විශේෂ දෙයක් තිබිය හැකි යැයි හැරි කල්පනා කළේය.

ඔහු එම දොරටුව හරස් කර තබා ඇති ගල් ඉවත් කරන්නට පටන් ගත්තේය.

සමහර ගල් ඉතා තදින් සිරකර තබා තිබූ අතර එවිට ගලවා ඉවත් කිරීමට දැඩි වෙහෙසක් දරන්නට සිදු විය. තවත් සමහර ගල් අවුරුදු දොළහක් වයසැති හැරි වැනි ළමයෙකුට එසවීම ඉතාමත්ම අසිරු විය. එනිසාම ඔහුට කරන්නට සිදුව තිබුණේ සිතුවාටත් වඩා ඉතාම අපහසු කාර්යයකි.

පැයක් පමණ කාලයක් හැරි එක දිගටම වැඩ කළේය. ඔහු තරමක විවරයක් පාදා ගත්තද එය කාමරයට ඇතුල්වීමට තරම්

ප්‍රමාණවත් නොවිය.

හැරීගේ නළල් තලයෙන් සහ පිට දිගේ දහඩිය රූරා හැලෙන්නට විය. මඳ අඳුරේ අධික වෙහෙසින් වැඩ කිරීම නිසාම ඔහුට දැඩි පිපාසයක් දැනෙන්නට විය.

වැඩ කිරීම නතර කළ ඔහු මොහොතකට පසෙකින් බිම වාඩි විය. ගමන් මල්ලේ තිබූ සැන්ඩ්විච්වස් පෙති කීපයක් සහ සෝඩා බෝතලය පිටතට ගත්තේය. තමා කුහරය තුළින් පහතට ඇද වැටෙද්දී මේවා ඉවතට විසි නොවීම වාසනාවක් යැයි ඔහු සිතීය.

සැන්ඩ්විච්වස් පෙති කීපයක් හා සෝඩා බීමෙන් පසු වෙහෙස නිවී යළිත් ඔහුට ශක්තිමත් බවක් දැනිණ. යළිත් ඔහු ගල් කුට්ට සමග හැටෙන්නට පටන් ගත්තේ තුන්වන කාමරය තුළ තිබෙන යමක් වේ නම් ඒ මොනවාදැයි දැන ගැනීමේ දැඩි අදිටනිනි.

ඉහළ කුහරයෙන් ගලා එන මන්දාලෝකය තම කාර්යය සඳහා මදි බව ඔහුට වැටහිණ. එනිසාම ඔහු තම විදුලි පන්දම දල්වා පසෙකින් වූ ගලක් මත තැබුවේ එහි ආලෝකය තමාට අවශ්‍ය තැනට එල්ලවෙන පරිද්දෙනි. අනතුරුව ඔහු දොරටුව වැසී ඇති ගල් එකින් එක ගලවන්නට පටන් ගත්තේය.

කුහරයෙන් ගලා එන හිරු එළිය තව තවත් අඩු විය. විදුලි පන්දමේ බැටරිවල බලයද කෙමෙන් අඩු වූ නිසා එයින් ලැබෙන ආලෝකය ද හීන විය.

අවසානයේදී ඔහුට තුන්වන කාමරයට යා හැකි තරමට කුහරයක් සාදාගත හැකි විය.

විදුලි පන්දමක් ගෙන කුහරයෙන් ඇතුල් වුවද බැටරිවල බලය බෙහෙවින් අඩුව තිබූ නිසා අවට ඇති යමක් දැක ගැනීමට තරම් ආලෝකයක් නොවිය.

මොහොතක් ගතවීමෙන් පසු හැරීගේ දෙනෙත් මඳ අඳුරට හුරු විය.

එවර වටපිට බැලූ ඔහුට කාමරයේ කෙළවරක ගල් වලින් සැකසූ අඩි තුනක් පමණ පළල අඩි හයක් පමණ දිග ඇඳක් වැනි දෙයක් දක්නට ලැබිණ.



හැරී විදුලි පන්දම් ආලෝකය ඒ මතට එල්ල කළේය. ඒ සමගම ඔහුට දක්නට ලැබුණේ හිත තිගැස්සෙන දෙයකි.

ඒ මත තිබුණේ දිරා ඉරී ගිය රෙදි කඩක දැවටුණු මිනිස් ඇටසැකිල්ලකි. එහි සමහර ඇටකටු නොතිබුණු අතර හිස්කබල සුරක්ෂිතව තිබිණ.

මෙය සාමාන්‍ය මිනිසකුගේ ඇටසැකිල්ලක් නොවන බව හැරීට සිතිණ. එහි හිස්කබල අසල පිහාටු දෙකක් සවිකළ ඔටුන්නක් වැනි දෙයක් තිබිණ. ගෙල තිබූ තැන පච්ච ගල් මාලයක් තිබිණ. තවත් ස්වර්ණාභරණ සහ කැඩී ගිය මැටි භාජන කැලි කීපයක් ඇටකටු අසල තිබිණ.

ඇටසැකිල්ල එති තිබූ දිරාගිය රෙද්ද ලෝගුවක් වැනි එකකි. මායා නුවර සාමාන්‍ය මිනිසුන් හැඳ සිට ඇත්තේ ඉඟටියේ සිට පහළට එල්ලෙන සායක් වැනි ඇඳුමක් බව හැරී අසා තිබිණ. එකල කාන්තාවන්ගේ ඇඳුම වී තිබුණේ උරහිසේ සිට පහළට දිගු ඇඳුමකි.

ඉහළ පෙළේ අයගේ ඇඳුම් හොඳ රෙදි වලින් සකස් කර විවිධ පාට කුරුළු පිහාටු අල්ලා තිබී ඇත. ධනවතුන් වටිනා ස්වර්ණාභරණ ආදිය පැළඳ සිට ඇත.

මායාවරු මළ විට ඔවුන් භූමදානය කර ඇත්තේ සිරුරෙහි රතු පාටක් ආලේප කර රසායන ද්‍රව්‍යයක් ගැල්වූ පිදුරුවල ඔතාය.

මායා පාලකයින්ගේ මළ සිරුරු ඔවුනගේ රාජකීය ඇඳුම් පැළඳුම් අන්දවා, ආභරණද සමගින්ම පිරමීඩවල තැන්පත් කර ඇත.

ඔවුන් සමගම කිසිදු පළඳනාවක් නොමැතිව සේවක සේවිකාවන්ද භූමදානය කර ඇත. එසේ සේවක සේවිකාවන් භූමදානය කරද්දී හැලි වලං ද ඔවුන් සමගම වල දමා ඇත. ඒ ඊළඟ ආත්මයේදී ප්‍රයෝජනයට ගනු පිණිසය.

හැරී දුටු ඇටසැකිල්ල තිබුණේ අන් ඒවාට වඩා උස පිරමීඩයකය. එහි වටිනා ඇඳුමක් මෙන්ම හිස් පළඳනාවන්ද

තිබුණා. ඒ සමගම වටිනා මැණික් ආභරණද එහි විය.

මෙම ඇටසැකිල්ල නිසැකයෙන්ම මායාවෙහි පාලකයෙකුගේ බවට හැරී තීරණය කළේය.

ඇටසැකිල්ල අසල තිබූ වෙනස් ආකාරයේ ආභරණයක් හැරීගේ නෙත් හි ගැටුණා. ඔහු මඳක් නැඹුරුව එදෙස බැලීය.

එය කර මාලයෙහි තැල්ලක් සේ සවිකර තිබූ වල් තාරා හිසක ස්වරූපය ඇති මැණික් ගලකි.

වල් තාරා හිසක හැඩැති මැණිකක් පැළඳ සිටීම මායාවෙහි සංස්කෘතිය අනුව උසස්ම දුනුවරයෙකු හෝ පාලකයෙකු බවට හැඟවීමට බව දෙමාපියන් කතා වෙනු හැරී අසා තිබුණා.

"ඒ වුණාට අම්මයි තාත්තයි නම් මම සොයාගත්තු දේ ගැන කිවුවාට විශ්වාස කරන එකක් නැහැ !"

හැරී සිතුවේය.

ඒ නිසා මේ පුවත සනාථ කිරීමට ඔවුනට යම් සාක්ෂියක් හෝ පෙන්විය යුතුය. එනිසාම හිස් කබල අතට ගත් ඔහු එය තම ගමන් මල්ලේ රුවා ගත්තේය.

මේ වනවිට සෑහෙන වේලාවක් ගතව ඇති නිසා ආපසු යා යුතු යැයි හැරී තීරණය කළේය.

එත්වටම ඔහුට මායාවරුන්ගේ ශාපය මතක් විය. මායා රටේ පාලකයෙකුගේ ඇටකටුවක් හෝ ස්වර්ණාභරණයක් හෝ තිබෙන තැනකින් ගන්නා කෙනෙකුට අත්වන ඉරණම ගැන ඇසූ කතා ඔහුට සිහිපත් විය.

"බැහැ..... එහෙම වෙන්න විදිහක් නැහැ. අම්මයි තාත්තයි කිව්වෙ ඒක කටකතාවක් කියලයි. ඔවුන් විද්‍යාඥයෝ. ඒ නිසා මේවා ගැන හොඳට දන්නා එයාලා කියූ දේ තමා හරි."

එසේ තමාටම කියාගත් හැරී හිස්කබල ගෙන යාමට තීරණය කළේය.

එය ගෙන ගොස් දෙමාපියනට පෙන්වූ විට ඔවුන් පුදුමයට



මෙන්ම සතුටටද පත්වනු ඇතැයි ඔහු සිතීය.

ඒ සමගම ඔහුට තවත් භයානක දෙයක් මතක් විය. එනම් මෙතැනින් පිටව යන්නේ කෙසේද යන්නය.

# 09

හැරී සොහොන් ගැබෙන් පිටතට ආවේය. තමා වටා ඇති විශාල පිරමීඩය තුළට තමා ඇද වැටුණු ඉහළින් ඇති කුහරය දෙස බැලිය.

එය ඇත්තේ අඩි විස්සකටත් වඩා ඉහළිනි. ඉහළ සිට කවුරුන් හෝ කඹයක් දමා ඒ ආධාරයෙන් උඩට නොගතහොත් තමාට මෙතනින් පිටවිය නොහැකි බව ඔහුට වැටහිණ.

ඔහු උදව් ඉල්ලා කෑ ගැසීය.

ඔහුගේ කටහඬ විශාල කුහරය තුළ මහ හඬින් දෝංකාර නැගීය. අනතුරුව උදාවුයේ දැඩි නිශ්ශබ්දතාවයකි.

ඔහු යළිත් වරක් කෑ ගැසීය.

එහෙත් එයින් ද පළක් නොවීය.

මේ පිරමීඩය පිහිටා ඇත්තේ හුදකලා වනගත පෙදෙසකය. මේ අසලකට හෝ පැමිණ ඇත්තේ කිපදෙනෙක් පමණකි. එවන් තැනක සිට කරන කෑ ගැසීම කිසිවෙකුට නොඇසෙන බව සුළු මොහොතකින් හැරීට වැටහිණ.

ඔහු තමා සිටින තරමක් උස පිරමීඩයෙන් පහතට බැස නටබුන් අතර ඇවිදින්නට විය. මෙම නටබුන් සහ කුඩා පිරමීඩ වටකර ඇති විශාල පිරමීඩයෙන් පිටවිය හැකි තැනක් ඇත්දැයි ඔහු විපරම් කරන්නට පටන් ගත්තේය.



හැරීගේ සිතට බියක් දැනෙන්නට විය. මෙම නටබුන් අතර පිරිසිදු වාතය ඇත්තේ මඳ වශයෙනි. මෙතැනින් පිටව යන මගක් සොයා නොගත්තොත් ඔහුට සිදුවන්නේ හුස්ම ගැනීමේ අපහසුතාවයෙන් මිය යන්නටය.

එසේ වුවහොත් ඔහු මෙතුළම තනිවෙනු ඇත. බොහෝ නටබුන් ඇති ටිකොල් පෙදෙසේ ඔහු කොයි අත ගියාදැයි ඔහුගේ දෙමාපියනටද සොයාගත නොහැකි වනු නිසැකය.

මෙවන් තැනකට එන බව ඔහු ගමනට පෙර දෙමාපියනට පැවසුවේ නැත. එසේ පැවසුවානම් ඔවුන් මේ ගමනට අවසර දෙන්නේ නැත.

හුස්ම ගන්නා වාතය කෙමෙන් කෙමෙන් රළු වෙනු ඔහුට දැනෙන්නට විය. එයට හේතුව එම වාතයෙහි ඇති ඔක්සිජන් වායු ප්‍රමාණය අඩුවීම බව ඔහුට වැටහිණ. ඔහු ඉතා තදින් ආශ්වාස ප්‍රාශ්වාස කරන්නට පටන් ගත්තේය. ඒ සමගම ඔහු හිතේ බිය මැඩ ගන්නට උත්සාහ කළේය.

අවසානයේදී ඔහුගේ නෙත් වලට බලාපොරොත්තුවක් තැබිය හැකි දෙයක් දිස් විය.

ඒ පිරමීඩයේ පහතම කෙළවරේ එක් තැනකින් ඇතුළට ඇදී එන සියුම් ආලෝක දහරකි.

වහා එතැනට දිව ගිය ඔහු ඒ කුඩා සිදුර අවට ඇති ගල් ගලවන්නට පටන් ගත්තේය.

සිදුරු තරමක් ලොකු විය. නැවුම් වාතය පිරමීඩය තුළට ගලා එන්නට පටන් ගැනිණ.

හැරී තනිවම සිනාසෙන්නට පටන් ගත්තේය. නිදහස ලබා ගැනීමට හැකි බවේ සතුට ඔහුගේ හිත පුරාම දෝර ගැලුවේය.

හිටි ගමන් ලෝම සහිත තරමක් මොලොක් දෙයක් ඔහුගේ එක් කකුලක විළුඹෙහි වැදෙනු ඔහුට දැනිණ.

ඔහු වහාම එදෙස බැලිය.

කහ පැහැති දීප්තිමත් ඇස් දෙකකින් යුත් විශාල මීයෙකු

ඔහුට දැනෙන්නට ලැබිණ. දා ඉදිරි පාද දෙක ඔසවාගෙන හැරීගේ කකුල දිගේ ඉහළට නගින්නට උත්සාහ දැරීය.

"ඒ.....යා.........න්....."

ඔහුට උස් හඬින් කෑ ගැසිණ. ඒ සමග ඔහු භීතියෙන් කකුල ගැස්සීය.

වහා ඉවතට පැන ගත් මීයා අඳුර අතරින් කොහෙටදෝ දිවුවේය.

මීයා නිසා හිතේ ඇතිවූ බිය හැරීගේ ක්‍රියාත්මක බව වේගවත් කළේය. ඔහු සිදුර විසල් කිරීම සඳහා හැකි ඉක්මනින් ගල් ඉවත් කරන්නට විය. ඔහුට අවශ්‍ය වූයේ තවත් යෝධ මීයෙකු විත් ඇල්ලක් ගපන්නා සේ තම කකුල ගපන්නට පෙර මෙතැනින් ඉවත් වීමටය.

සෑහෙන වේලාවක් ගතවෙන්නට පෙර සිදුර තමාට රිංගා යාමට හැකි තරමට ලොකුකර ගැනීමට ඔහු සමත් විය. මුලින්ම ඔහු හිස්කබල රැඳි තම ගමන් මල්ලත්, විදුලි පන්දමත් සිදුරෙන් පිටතට දැම්මේය. අනතුරුව ඔහු මුලින්ම හිස පිටතට දමා ඊළගට ඇඟද පිටතට ගත්තේය.

පිරමීඩයෙන් පිටතට පැමිණෙත්ම ජීවිතයේ කිසිදාක ඇති නොවූ අන්දමේ සතුටක් ඔහුට ඇති විය.

හිරු බැස යමින් තිබිණ. ඔහු ඇගේ තැවරී ඇති දූවිලි සහ ගලා ආ දහඩිය පිස දා ගත්තේය. ඔහුට තද වෙහෙසක් මෙන්ම කුසගින්නක් ද දැනෙන්නට විය.

දෙමාපියනට තමා සොයාගත් මායා රජෙකුගේ හිස්කබල පෙන්වන තුරු ඔහුට ඉවසුමක් නොවීය.

ඔහු නිවහන බලා ගමන් ඇරඹීය.



# 10

"හරිම අපූරුයි පුතේ........"

හැරී ගෙන ආ හිස්කබල පරීක්ෂා කරමින් පියා පැවසීය.

ඔහු ඉතා සූපරීක්ෂාකාරී ලෙස හිස්කබල ඒ මේ අතට හරවමින් පරීක්ෂා කළේය.

ඇටසැකිල්ල අවට තිබූ ආභරණ සහ පළඳනා ගැන හැරී විස්තර කළේය. ඒ අසා සිටි දෙමාපියන් එම ඇටසැකිල්ල නියත වශයෙන්ම මායාවෙහි පාලකයෙකුගේ බව නිගමනය කළහ.

"මේක ඉතාමත්ම වැදගත් සොයා ගැනීමක්. කිසිම පුරා විද්‍යාඥයෙක් මෙතෙක් සොයාගෙන තිබුණේ නැහැ ඔය කොටසේ පිරමීඩවල මායා රජෙකුගේ සොහොන් ගැබක් තියෙන බව."

පියා එසේ කී විට හැරීට දැනුණේ දැඩි ආඩම්බරයකි.

පසුදින හැරී සමග සැඟවුණු ලෝකය දැක බලාගැනීමට පියා තීරණය කළේය. මවට පසුදින වෙනත් තැනක විශේෂ කැණීම් කටයුත්තක යෙදෙන්නට තිබිණ. එනිසා හැරී සොයාගත් සොහොන් ගැබ බැලීමට වෙනත් දිනයක පැමිණෙන බව ඇය කීවාය.

පසුදින උදයේ හැරී සහ පියා සැඟවුණු ලෝකය බලා පිටත් වූහ.

විශාල පිරමීඩය උඩට දෙදෙනා නැග ගත් පසු පෙරදින තමා පහතට ඇද වැටුණු විවරය හැරී පියාට පෙන්වීය.

එය බැලීමෙන් අනතුරුව දෙදෙනාම පහළට බැස්සාහ.

පෙරදින තමා විශාල පිරමීඩයෙන් පිටතට වීංගා ආ කුහරය හැරී පෙන්වීය.

මෙම පිරමීඩය තුළට ඇතුල්වීමට සහ පිටවීමට හැකි කැනු තමාට සොයා ගැනීමට හැකිවීම ගැන හැරී තුළ ඇතිවූයේ දැඩි අභිමානයකි.

දෙදෙනාම එක්ව හැරීගේ පියාට ඇතුල් විය හැකි පරිදි ගල් ඉවත් කර කුහරය විශාල කළහ.

අනතුරුව පියාත් පුතාත් එම කුහරය තුළින් බඩගා විශාල පිරමීඩය තුළට වීංගූහ.

"අන්න අර පිරමීඩය උඩට තමා අපි නගින්න ඕන."

හැරී තම විදුලි පන්දමේ ආලෝකය පෙරදින තමා ඇටසැකිල්ල සොයාගත් පිරමීඩය වෙත එල්ල කරමින් පැවසීය.

පියාත් පුතාත් එක්ව එම පිරමීඩය උඩට නගින්නට පටන් ගත්හ.

හිටගමින් හැරී පය ගැසූ ගලක් බුරුල් වී තිබීම නිසා ගැලවී ගියේය.

"පුතා...... පරිස්සමින්..."

පියා කෑ ගැසීය.

තවත් ටිකක් ඉහළට නගිද්දී හැරීගේ පියා පය තැබූ ගලක් ගැලවී ගියේය. සමබරතාවය නැතිව ගිය ඔහු පහතට ඇද වැටේ යැයි හැරී තිගැස්සීය. එහෙත් පියා ඉහළින් වූ ගල් පඩියක් දෙඅතින්ම අල්ලාගෙන සිය සමබරතාවය රැක ගත්තේය.

ඉහළට නගා ගත් ඔවුනු තුන්වන කාමරය වන සොහොන් ගැබ තුළට විදුලි පන්දම් ආලෝකය එල්ල කළහ. පෙරදින හැරී දුටු අන්දමටම ඇටසැකිල්ල සහ අනෙක් දේවල් තිබිණ.

හැරීගේ පියා එම ඇටසැකිල්ල, ආභරණ සහ අනෙකුත් දේවල් දැඩි විමසිල්ලෙන් පරීක්ෂා කරන්නට විය.



"මේ සොහොන් ගැබේ විශේෂත්වයක් තියෙනවා. මේ ඇටසැකිල්ල පුරා විද්‍යාඥයින් මීට පෙර සොයාගත් මායා රජවරුන්ගේ ඇටසැකිලිවලට වඩා හුඟක්ම පරණයි."

ආභරණ ආදී දේ පරීක්ෂාකර බැලීමෙන් පසු හැරීගේ පියා පැවසීය.

"ඉතින් දැන් අපි මොකද කරන්නෙ......?"

හැරී ඇසීය.

"මේ දවස්වල නම් කිසිම දෙයක් කරන්න බැහැ. වැහි කාලෙට ඉස්සරින් දැනට අම්මයි මමයි කැණීම් කරන කොටසේ වැඩ ඉවර කරන්න තියෙනවා. වැහි කාලය ඉවරවෙන තුරු අපිට මේ පැත්තෙ කිසිම වැඩක් කරන්නට ඉඩක් නැහැ. ඒ නිසා මෙහෙට එන්නට වෙන්නේ තව මාස කීපයකට පස්සෙයි."

"ඒත් කවුරුහරි මේ තැන හොයාගෙන වටිනා දේවල් හොරකම් කරගෙන ගියොත්"

හැරී ප්‍රශ්න කළේය.

"තව අවුරුදු ගණනාවක් යනතුරු කිසිම කෙනෙක් මේ පිරමීඩය සොයා ගනීවි කියලා මම නම් හිතන්නෙ නැහැ."

එසේ කියූ ඔහු සිනහවකින් සැරසී හැරී දෙස බැලීය.

"හැබැයි ඒ ඔයා තනිවම මෙහෙ ආවෙ නැතිනම් විතරයි. අපි ඔයා.... පහළට ඇද වැටුණු විශාල පිරමීඩයෙ කුහරය වසා දමමු. එතකොට කිසිම කෙනෙකුට මේ සොහොන් ගැබ හොයාගන්න පුළුවන් කමක් නැහැ."

පියා වැඩි දුරටත් පැවසීය.

අනතුරුව ඔහු තව දුරටත් ඒ අවට විපරම්කර බැලීය.

ටික වේලාවකට පසු හැරී සහ පියා පටු ගල් පඩි පේළිය දිගේ පහතට බැසීම ඇරඹූහ.

මුලින් පියා පහතට බසින්නට වූ අතර දෙවනුව හැරී බසින්නට විය.

ක්‍රිස් කෙලර් ගල් පඩි දහයකින් පමණ පසු පය තබා තිබුණේ බුරුල් වූ ගලකටය. පය වාරු ගිලිහී ඔහු සිය සමබරතාවය රැක ගැනීමට ඉහළින් වූ ගලක් දෙඅතින් බදා ගන්නට උත්සාහ කළේය.

එහෙත් එම උත්සාහය අසාර්ථක විය.

ක්‍රිස් කෙලර් පහතට ඇද වැටිණ.

"තාත්තේ.........."

හැරී යටිගිරියෙන් කෑ ගැසීය.

"තාත්තේ.......... ඔයාට මොකද වුණේ.......?"

එහෙත් පියාගෙන් කිසිදු ප්‍රතිචාරයක් නොවීය. හැරීට ඇසෙන්නට වූයේ තම හදවතේ ස්පන්දනය පමණකි.



# 11

හැරී තමාට හැකි උපරිම වේගයෙන් පඩි පෙළ දිගේ බසින්නට විය. එක අතකින් දැල්වූ විදුලි පන්දමත් ගෙන අනෙක් අතින් ගල් පඩි අල්ලමින් පටු ගල් පඩි දිගේ පහතට බැසීම ඉතා අසීරු එකකි.

පිරමීඩයෙන් පහතට බැස ගත් ඔහුට බිම ඇද වැටී සිටින පියා දැකගත හැකි විය. පියා වැටී හුන්නේ උඩබැලි අතටය. ඔහුගේ හිසෙන් රුධිරය වැගිරෙමින් තිබිණ. එමෙන්ම ඔහු සිටියේ සිහිසුන්වය.

ඔහු පියාගේ නාඩි වැටේදැයි අල්ලා බැලීය. නාඩි වැටෙමින් තිබිණ.

හැරී තමන් ගමන් බෑගය කොට්ටයක් සේ සිටින ලෙස පියාගේ හිසට යටින් තැබීය. අනතුරුව ඔහු එතැනින් නික්ම පිරමීඩය තුළට ඇතුළු වූ කුහරයෙන් බඩගා පිටතට රිංගා ගියේය.

එතැන් සිට ඔහු තම් මව සිටින වැඩ බිම කරා හැකි උපරිම වේගයෙන් දුවන්නට පටන් ගත්තේය. විනාඩි පහකින් පමණ ඔහුට එතැනට ළඟා වීමට හැකි විය.

මව ඇතුළු පිරිසක් එතැන පිරමීඩය තුළ ගවේෂණ කටයුතු කරමින් සිටියහ. එතුළට පිටස්තර අයට ඇතුළුවීම තහනම් කර තිබිණ. සාමාන්‍ය මායාවරුන් දෙදෙනෙක් ඇතුල්වන තැන මුරට සිටියහ.

"අම්මේ___ පුළුවන් තරම් ඉක්මනට එන්න."

හැරී කෑ ගැසීය.

විනාඩියක් ගතවෙන්නත් පෙර හැරීගේ මව පිරමීඩයෙන් පිටතට ආවාය.

ඇය සමග සේවය කරන පුරාවිද්‍යාඥයින් දෙදෙනෙක්ද වූහ. ඔවුනගේ ඇඳුම්වල සහ සිරුරුවල දූවිලි තැවරී තිබිණ.

"ඇයි හැරී මොකද......?"

"තාත්තාට______ තාත්තාට තුවාල වෙලා."

එසේ කියමින් මවගේ අත් දෙක අල්ලාගත් හැරී පියාට සිදුවූ දේත් තුවාල ගැනත් විස්තර කළේය.

"ළඟම ඉන්න දොස්තර ඉන්නෙ ෆ්ලෝරන්ස් නගරයෙ. මෙහෙ ඉඳන් එහෙට යන්න පැයක විතර කාලයක් ගතවෙනවා."

එසේ පැවසුවේ පුරා විද්‍යාඥයෙකු වන ඩුබී නිව්න්ස් ය.

නිව්න්ස් ඔහුගේ කලිසම් සාක්කුවකින් ජංගම දුරකථනයක් පිටතට ගත්තේය. වහා අංක කීපයක් එබූ ඔහු ස්පාඤ්ඤ භාෂාවෙන් කා සමග දෝ කතා කරන්නට විය. එම කතාවට විනාඩි දෙකක පමණ කාලයක් ගත විය.

"මම ෆ්ලෝරන්ස් රෝහලට කතා කළේ. එයාලා දැන්මම හෙලිකොප්ටරයක් එවන්නම් කිවුවා."

නිව්න්ස් පැවසීය.

හැරී සහ මව සැඟවුණු ලෝකය දෙසට දුවන්නට වූහ.

හැරී මග පෙන්වමින් මුලින් දිවූ අතර මව ඔහු අනුගමනය කළාය. අනෙක් පුරා විද්‍යාඥයින් දෙදෙනා හෙලිකොප්ටරය පැමිණෙන තුරු ඊතෝල් පෙදෙසට ඇතුළුවන තැන දෙසට ගමන් කළහ.

සැඟවුණු ලෝකය කරා දිව ගිය මව සහ පුතා පියා අසළට ළඟා වූහ. ඒ වන විටත් ක්‍රිස් සිටියේ සිහිසුන්වය.



දෙදෙනාම ක්‍රිස් දෙපස දණ ගසා ගත්හ. එහෙත් අසරණව බලා සිටිනවා හැරෙන්නට ඔවුනට කළ හැකි දෙයක් නොවිය. හැරීගේ මව ලේන්සුවක් ගෙන තම සැමියාගේ හිසෙන් ගලා එන රුධිරය පිස දමන්නට වූවාය.

අධික බිය නිසාම හැරීගේ නළලතින් දහඩිය වැගිරෙන්නට විය. තම පියාට සුවපත් වේවා යැයි ඔහු යටි සිතින් ප්‍රාර්ථනා කරන්නට පටන් ගත්තේය.

මේ අතර වෛද්‍ය ආධාර රැගත් කණ්ඩායම එම පිරමීඩය අසලට ළඟා වූහ.

එහෙත් එතැනදී ඔවුනට බලවත් ගැටළුවකට මුහුණ දෙන්නට සිදුවිය. එනම් පිරමීඩයට ඇතුළු වන්නට සකසා ගත් කුහරය තුළින් ඇතුළට ගිලන් ඇඳ ගැනීමට නොහැකි වීමය.

නිව්න්ස්, අනෙක් පුරා විද්‍යාඥයා සහ වෛද්‍ය සේවකයින් දෙදෙනාත් කුහරය තුළින් ඇතුළට රිංගුහ. වෛද්‍ය සේවකයින් දෙදෙනා විනාඩි දෙකක් පමණ හැරීගේ පියා දෙස බලා සිටියහ.

අනතුරුව ඔවුහු සිව්දෙනා එකතුව තුවාලකරුවා සිදුර අසලට ඔසවාගෙන ආහ.

සිව් දෙනාගෙන් දෙදෙනෙකු කුහරයෙන් පිටතට ආ අතර ඇතුළත සිටි දෙදෙනා ක්‍රිස් ඔසවා පිටත සිට අය අතට පත් කරන්නට පටන් ගත්හ.

එය ඉතා අපහසු වෙහෙසකාරී කටයුත්තක් විය.

අවසානයේදී ක්‍රිස් කෙලර් රෝහලට ගෙන යාමට හෙලිකොප්ටරයට ගොඩ කළ අතර හැරී ද තම මව සමග එම ගමනට එකතු විය.

රෝහලේදී පියා වාට්ටුවකට රැගෙන ගිය අතර හැරීට මව සමග විවේක කාමරේහි සිටින්නට සිදු විය. පැයකට පමණ පසු පැමිණි වෛද්‍යවරයෙකු ඔවුනට කතා කළේය.

ක්‍රිස්ගේ හිසට සිදුව ඇති බරපතල තුවාල නිසා තද කම්පනයකින් ඔහු සිහිමූර්ඡා වී සිටින බව වෛද්‍යවරයා පැහැදිලි කළේය.

"තාත්තා ඉන්නෙ මරණාසන්නවද....?"

හැරී දොස්තරගෙන් ඇසීය.

"ඒ ගැන කියන්න තවම කල් වැඩි පුතා.... ඔහුගේ ජීවිතය රැකගන්නට අපි අපට පුළුවන් උපරිම උත්සාහය ගන්නවා."

දොස්තර පිළිතුරු දුන්නේය.

හැරී සහ ඔහුගේ මව ක්‍රිස් සිටින රෝහල් කාමරය වෙත ගියහ.

ඇතුලුවෙත්ම දුටු දෙයින් තුස්ත වූවාක් සේ හැරී ගල් ගැසුණු අයුරින් නතර විය.

ක්‍රිස් කෙලවර යහනෙහි උඩුබැලි අතට දිගාව හුන්නේය. ඔහුගේ දෙනෙත් පියවී තිබුණු අතර නාස් පුඩු තුලින් ඇතුළට ප්ලාස්ටික් බට දමා තිබිණ. එම බට සම්බන්ධ කළ බෙහෙත් බෝතලයක් ඇඳ අසල එල්ලා තිබිණ.

හැරීත් ඔහුගේ මවත් ඇඳ අසල සිටගෙන දෙඅත් බැඳගෙන ශූන්‍යවතින් යුතුව බලා සිටියහ. සමහර අවස්ථාවල අම්මා සෙමින් ඉකිබිඳින හඬ ඇසෙද්දී හැරීටද හැඬෙන්නට ආවේය. තම පියාගේ ආපදාවට වග කිවයුත්තේ තමා යැයි ඔහුට සිතිණ.

හැරීට සහ මවට රාත්‍රියේදී ද රෝගියාගේ යහන අසලම සිටින්නට අවශ්‍ය විය. එහෙත් එසේ සිටීම අනවශ්‍ය දෙයැකියි වෛද්‍යවරයා පැවසීය.

"දැන් යන්න. ගෙදර ගිහින් විවේක ගන්න. අපි පරීක්ෂාමින් හොඳට ලෙඩාව බලා ගන්නම්."

වෛද්‍යවරයා කාරුණික ස්වරයෙන් පැවසීය.

ඒ අවස්ථාවේ නිවින්ස් කාරයකින් රෝහල කරා පැමිණියේය. හැරී සහ මව ඔහු සමග තවත් ස්වල්ප වේලාවක් ක්‍රිස්ගේ ඇඳ අසල රැඳී සිටියහ.

එහෙත් ක්‍රිස්ගේ තත්වයෙහි කිසිදු වෙනසක් ඔවුනට පෙනුණේ නැත. අඩුම තරමින් ඔහු ඇසිපිය හෙලුවේවත් නොමැත.



ටික වේලාවකට පසු හැරී සහ ඔහුගේ මව නිවින්ස්ගේ රථයෙන් ආපසු විකෝල් බලා පිටත් විය.

"ඔයයි ඔයාගෙ තාත්තයි දෙන්නා සැඟවුණු ලෝකය තොටසේ මොකද කළේ....? අනිත් එක ඔයාගේ තාත්තා එහෙට ගියේ ඇයි කියලා මට තේරෙන්නෙ නැහැ...."

කාරය පදවන අතරතුර නිවින්ස් පැවසීය.

හැරී මායා රජුගේ ඇටසැකිල්ල ගැන කතාව කියන්නට පැකිලිණ. ඒ සමගම ඔහුට සිතුණේ නිවින්ස් කෙතරම් හොඳ පුද්ගලයකු වුවද ඔහු සමග හොඳ හා සමගවත් වටිනා පුරා වස්තු ඇති තැන් ගැන නොකිවයුතු බවය.

"තාත්තා මට කැණීම් කරන විදිය පෙන්වන්න ගියා. ඒත් එතැන කිසිම දෙයක් තිබුණෙ නැහැ. අන්තිමේදී අනතුරක් වුණු එක විතරයි සිද්ධ වුණේ."

හැරී නිවින්ස් හට පැවසීය.

හැරීත් මවත් නිවසට යන විට රෑ බෝ වී තිබිණ. රෑ ආහාර ගැනීමට නොහැකි තරමට දෙදෙනා වෙහෙසටත් කම්පනයටත් පත්ව සිටියහ.

එනිසාම ආහාර නොගෙනම දෙදෙනා නිදාගන්නට කාමර වලට ගියහ.

ඇඳුම් මාරු කළ හැරී මදුරු දැල සකස්කර ඇඳට ගොඩ විය.

විනාඩි කිහිපයකට පමණ පසු තම කකුලක දඟලන දෙයක් ඔහුට දැණිනි. ඒ සමගම කිසිදාක නොදැනුණු අත්දමේ වේදනාවක්ද ඔහුට දැනිණ.

ඔහු කකුල බදාගෙන කෑ ගැසීය.

# 12

වේදනාවෙන් කෑ ගසන හැරිට චිමිනි ලාම්පුවක් ඔසවාගෙන අම්මා කාමරයට එනු දක්නට ලැබිණ. ඒ වෙනවිටත් හැරි බදාගෙන හුන් ඔහුගේ කකුලේ වේදනාව වැඩිවෙමින් පැවතිණ.

කෑ ගසන අතරම වටපිට බැලූ ඔහුට වේගයෙන් ඇදී යන ගෝනුස්සෙකු දක්නට ලැබිණ. ඒ සමගම තමාට වේදනාවක් ඇතිවීමට හේතුව ඔහුට වැටහිණ. ඇඳේ ගෝනුස්සෙකු සිටින්නට ඇත. ඇඳට නැගී තමාගේ කකුලට තෙරපෙන විට ඌ දෂ්ට කරන්නට ඇතැයි ඔහු සිතීය.

හැරිට මීට පෙර ගෝනුස්සෙකු දෂ්ට කර නොතිබුණද ගෝනුසු විෂ දැඩි වේදනා ගෙන දෙන්නක් බව ඔහු අසා තිබිණ. එය සත්‍යයක් බව ඔහුට මේ මොහොතේ පැහැදිලි විය. එපමණක් නොව තමා සිතුවාටත් වඩා වේදනාත්මක බව ඔහුට දැනිණ.

ගෝනුස්සා කාමරයෙන් පිටතට දිව යනු හැරීගේ මව දුටුවාය. ආපසු හැරී ගිය ඇය වහාම ප්‍රථමාධාර පෙට්ටිය රැගෙන ආවාය.

වේදනා නාශක බෙහෙත් ගෝනුස්සා කෑ තැන ඇතිල්ලූ ඇය විෂ නාශක බෙහෙතක් එතැනට බැන්දාය.

හැරීගේ වේදනාව අඩු විය. මව කාමරයෙන් පිටව ගියාය.

හැරී යළි ඇඳට ගොඩ වුයේ ඇඳ ඇතිරිලි හොඳින් ගසා දැම්මෙන් පසුවය.

පසුදින නිවින්ස් ඔහුගේ කාරය එවුවේය. එහි හැරීත් මවත්



ක්‍රිස් බලන්නට රෝහලට ගියහ.

ඔවුහු ඔහුගේ ඇඳ අසල පැය දෙකක පමණ කාලයක් රැඳී සිටියහ.

ක්‍රිස් කෙලර්ගේ රෝගී තත්වයේ කිසිදු වෙනසක් වී තිබුණේ නැත. ඔහු ඒ වනවිටත් පසු වුයේ සිහිමුර්ජා වූ තත්වයේය.

ආපසු නිවසට පැමිණ දිවා ආහාරය ගත් පසු හැරීගේ මව පුරාවිද්‍යා කැණීම් කටයුතු සඳහා ගියාය. ක්‍රිස් කෙලර් වෙනුවට තාවකාලිකව හෝ වෙනත් පුරා විද්‍යාඥයෙකු එවනතුරු කැණීම් කටයුතු දිගටම කරගෙන යැම තම වගකීම බව ඇය දැනගෙන සිටියාය. එනිසාම සැමියා සුවපත් වන තුරු උදය වරුවේ ඔහු බැලීමට රෝහලට ගොස් පැමිණ ඉන් අනතුරුව පුරා විද්‍යා ගවේෂණ කටයුතුවල යෙදීමට ඇය තීරණය කළාය.

මව පිටත්ව ගිය පසු තම ගමන් මල්ලෙන් මායා රජුගේ හිස් කබල පිටතට ගත් හැරී යළිත් වරක් එය පරීක්ෂාකර බලන්නට විය.

එය විලිස්සා ගත් අයෙකුගේ හිස් කබලක් යැයි ඔහුට සිතිණ.

එම හිස් කබල තිබූ තැනින් ඉවතට ගැනීමෙන් තමා කළේ වරදක්දැයි හැරී කල්පනා කළේය. "තම පියා දීර්ඝ මුර්ජාවකට පත්වීමට හේතුව එයද....? තමාගේ කකුලට ගෝනුස්සෙකු දෂ්ට කළේ ඒ නිසාද.......? ඒ අර මායාවරුන්ගේ ශාපය නිසාද .........?" ඔහු සිතීය.

හිස් කබල ප්‍රවේශම් සහිතව තම ඇඳ යටින් තැබූ හැරී පිටතට ආවේය. වෙනදා මෙන්ම කාලගුණය පීඩාකාරී උණුසුමෙන් යුක්තය. නිවස අසල රැඳී කරන්නට දෙයක් හැරීට නොතිබිණ.

කැලයේ ඇවිදින්නට යන්නට ඔහු තීරණය කළේය. දහවල ගෙවී ගතව තිබුණේ කෙටි කාලයක් පමණකි.

ඒ වෙනවිට බොහෝ වන සතුන් පෙනෙන තෙක් මානයෙන් ඈත්ව සිටියහ. එහෙත් එතුවකට ඔහු දැක නොතිබුණු දෙයක් ඔහුට දකින්නට ලැබිණ.

විශාල දුඹුරු පාට බෝලයක් වැනි දෙයක් ගසක එල්ලී තිබෙන අයුරු ඔහුට දක්නට ලැබිණ. එය හොඳාකාරවම දැකගනු පිණිස ඔහු තරමක් ළඟට ගියේය.

එය දහස් සංඛ්‍යාත වෙයන්ගෙන් සැදුණු තුඹසකි. ඒ සමගම ඔහුට දක්නට ලැබුණේ අති විශාල රතු කූඹියන් මහත් රාශියක් ඔවුනටද වඩා විශාල කොළ ඔසවාගෙන එම ගස නගින අන්දමය. මොවුන් විෂ කූඹි විශේෂයක් යැයි හැරිට සිතිණ. එනිසාම ඔහු ඒ කූඹින් ආසන්නයට නොගියේය.

එම කූඹි පමණක් නොව වනාන්තරයේ මෙම කොටසේ දක්නට ලැබෙන හැම දෙයක්ම විශාල බව හැරිට සිතිණ. මෙම වනාන්තරයේ අනෙක් කෘමි සතුන් ද කූඹියන් මෙන්ම අති විශාලය. සමහර ගස්වල කොළ වැඩුණු මිනිසුන්ටත් වඩා ලොකුය. ගස්වල පිටට මතුව ඇති මුල් අඩි පනහකටත් වඩා දිගය.

හැරි අඩිපාර දිගේ තවත් ඉදිරියට ගමන් කරන්නට විය. ඔහු තව තවත් කැලය තුලටම ගියේය. එක ලඟ පිහිටි විශාල ගස්වල අතු වියනක් මෙන් එකිනෙකට බැඳී ඇති නිසා ඔහුට හිරු පෙනුණේ නැති තරම්ය. ඒ නිසාම කාලය ගෙවී යන බව ඔහුට නොදැනිණ.

සූර්ය කිරණ මගින් ඇඳී එන හිරු එළිය පොළොව මත වැටී ඇති රටා චමත්කාරජනකය. එසේම ගස් අතර ඇති අඳුරු පාට ස්වරූපය වටත් වඩා අපූරු යැයි හැරිට සිතිණ. මෙම ස්වභාවය නිසාම වනාන්තරයේ ඇවිදීම ආස්වාදජනකය.

මෙම ගමනේදී හැරිට දැනෙන්නට වූයේ තමා වෙනත් ලෝකයක සිටින සෙයකි. අතරමගදී ඔහුට මුණ ගැසුණේ මිනිසුන් කීප දෙනෙකු පමණකි. එයින් අවසන් තැනැත්තා මුණ ගැසී සෑහෙන වෙලාවක් ගෙවී ඇත.

ආපසු හැරෙන්නට පෙර තව ටික දුරක් යා යුතු යැයි ඔහුට සිතිණ.

මද දුරක් යද්දී තනිව ගස් කොළන් වලින් වටවූ මඩ සහිත එළිමහන් බිම් කඩකට ඔහු ළඟා විය. සති තුනකට පෙර වට වැස්සෙන් මඩව ඇති එම බිම් සම්පූර්ණයෙන්ම වෙලී තිබුණේ



ඇත.

එතැන පසුකර යත්ම අඩි පාර වැටී තිබුණේ කුඩා පොකුණක් වෙතය. එම පොකුණ අඩි පනහක් පමණ දිග අඩි පනහක් පමණ පළල එකකි. එය හරහා යාමට දිග ගසක් ඒ දණ්ඩක් මෙන් දමා තිබිණ.

අභියෝගාත්මක දේ කිරීමට හැරි කවදත් කැමතිය. එනිසාම ඔහු ඒ දණ්ඩ දිගේ ගමන් කරන්නට පටන් ගත්තේය. එම ගමන දැඩි සංයමයකින් කළ යුත්තක් විය. එම ඒ දණ්ඩ ඉතා පටු එකක් නිසා පියනැඟිය යුත්තේ ඉතාම ප්‍රවේශමෙනිය.

හැරි හෙමින් සීරුවේ, දැඩි කල්පනාවෙන් මෙන්ම පරිස්සමින් පියවර තබන්නට විය. පහළින් ඇති පොකුණේ වතුර පතුලවත් නොපෙනෙන අන්දමේ දුඹුරු පැහැයකින් යුක්ත විය.

හැරි සාර්ථකව පා තබා පොකුණේ මැද හරියට ළඟා විය. හිට හැටියේ ඔහුගේ නාසය මත මදුරුවෙකු වැසීය. මදුරුවා පන්නා දමන්නට හැරි අතකින් නාසය පිරිමැද ගත්තේය.

ඒ සමගම ඔහුගේ සමබරතාවය බිඳිණ. පොකුණට ඇද වැටෙද්දී ඔහු ඒ දණ්ඩ අල්ලා ගන්නට උත්සාහ කළේය. එහෙත් වැස්සට තෙමී තිබුණු ඒ දණ්ඩ ලිස්සා ගොස් ඔහු පොකුණට ඇද වැටිණ.

ඔහුට එක් වරම කණගාටු සිතුණේ තම සාක්කුවේ ඇති ගෝතමාලා මුදල් තෙමේවි කියාය. එහෙත් ඒ සමගම සිදුවූ හේතුවක් නිසා ඔහුගේ සිතට බියක් ඇති විය.

ඔහු ඉතා දක්ෂ පිහිනුම්කරුවෙකු වුවද මෙම පොකුණේ ඔහුට පිහිනන්නට නොහැකිවිය.

පොකුණේ ජලය මෙන් පතුලේ ඉතා සියුම් මඩය. ඒ මඩ ගොහොරුවේ අත පය ගසමින් පිහිනීමට නොහැකි විය. එසේ පිහිනන්නට උත්සාහ කරද්දී ඔහු මඩ ගොහොරුවේ ටිකෙන් ටික ගිලා බසින්නට විය.

ඔහුගේ දැගලීමේ වේගය වැඩි වෙද්දී ගිලීයාමේ වේගයද වැඩි විය.

ඔහු කෑ ගැසීය.

ජීවිතයේ කිසිදාක කෑ නොගැසූ තරම් උස් හඬින් කෑ ගැසීය.

ටික වේලාවක් යද්දී ඔහු ගෙල තෙක් මඩෙහි ගිලී ගියේය.

කාලය ගතවෙන්නට විය.



# 13

"මාව බේරාගන්න..... මාව බේරාගන්න...."

හැරී මර ලතෝනි තැබීය.

එහෙත් උදව්වක් තබා පිළිතුරු හඬක්වත් නොඇසිණ.

හැරීගේ සියළුම බලාපොරොත්තු කඩ විය. තමා මඩ ගොහොරුවේ ගිලී යන බව ඔහුට වැටහිණ. එහෙත් අවසාන මොහොත දක්වා නොගිලී සිටින්නට ඔහු උත්සාහ කළේය.

ටිකෙන් ටික කට ළඟටම ඔහු මඩ තුළට කිඳා බැස්සේය. ඔහු කට තුළට මඩ ඇතුල්වන්නට නොදී හිස පිටුපසට කර ගත්තේය.

"බේ.....රා.....ග.....න්.....න......"

ඔහු අවසාන වතාවටද කෑ ගැසීය.

එහෙත් කිසිම පිළිතුරක් නොලැබිණ.

සියළු බලාපොරොත්තු අත්හළ ඔහු ගිලී යන මොහොත උදෙසා දෙනෙත් පියා ගත්තේය. ඔහුට දෙමාපියන් සොහොයුරිය සහ මිතුරු මිතුරියන් සිහිපත් විය. එමෙන්ම තමන් කිරීමට බලාපොරොත්තුව සිටි බොහෝ දේවල් ද ඔහුට මතක් විය. වාහනයක් පැදවීම..... විදුහල් ගමන..... ලොව වටා සවාරියක් යෑම වැනි දේවල් ඔහුගේ අවශ්‍යතා අතර විය.

එනිසාම මෙවන් ඉක්මණින් මිය යාමේ උවමනාවක් ඔහුට නොවිය.

එහෙත් තවත් කළ හැකි යමක් නොමැත. ඔහු දෙනෙත් පියා ගත්තේය.

ඒ සමගම තම පපුවෙහි යමක් වැදෙනු ඔහුට දැනිණ.

ඔහු දෙනෙත් විවෘත කළේය.

තරුණ වියේ මායා පිරිමි ළමුන් දෙදෙනෙකු ඒ දණ්ඩ මත සිටිනු ඔහුට දක්නට ලැබිණ.

එක් ළමයෙකු ලියක් හැරීට අල්ලා ගැනීමට දිගුකර ගෙන සිටියේය. අනිත් ළමයා ඒ දණ්ඩ මත නැමුරුව හැරීව අල්ලා ගන්නට මෙන් අතක් දිගු කරගෙන සිටියේය.

හැරී අතක් ඔසවන්නට උත්සාහ කළේය. එහෙත් එය කළ නොහැක. ඒ තරමට මඩ උකුය.

ලිය අතැති ළමයා එය තව තවත් මඩ ගොහොරුව තුළට එබීය. හැරීගේ අතට ලිය අසුවිය. ඔහු එය තරයේ අල්ලා ගත්තේය.

ලිය අතැති ළමයා හැරී සමග ලිය උඩට අදින්නට පටන් ගත්තේය. ඔහු එසේ අදිනුයේ ඉතා අපහසුවෙන් බව පෙනිණ. ඔහු නොවැටෙන්න සේ ඒ දණ්ඩ මත හුන් අනෙක් ළමයා ඔහුව අල්ලාගෙන සිටියේය.

හැරී තමාට හැකි උපරිම ශක්තියෙන් ලිය අල්ලාගෙන හුන්නේය. මරණයෙන් ගැලවීමට ඔහුට කළ හැකිව තිබුණේ එපමණකි.

ටික වේලාවකින් කෙනෙකු තම අතකින් සහ කමිසයෙන් අල්ලාගනු හැරීට දැනිණ.

අනතුරුව හැරී ඒ දණ්ඩ මතට ගත් ළමයි දෙදෙනා ඔහුව යළිත් නොවැටෙන සේ අල්ලා ගත්හ.

සිහිසුන්ව මෙන් හුන් හැරී වත්තන් කරගනිමින් ළමයි දෙදෙනා ඔහු ඒ දණ්ඩ දිගේ ආපසු ගෙන ගියහ.



ඒ දණ්ඩෙන් එගොඩ වූ පසු ළමයි දෙදෙනා හැරීව බිම තැබූහ. හැරී උඩුබැලි අතට දිගා වූණේය.

ටික වේලාවකින් දෙනෙත් පියාගෙන සිටි හැරී යළි දෙනෙත් විවෘත කළේ තම ජීවිතය බේරූ මායා ළමයින්ට ස්තුති කරනු පිණිසය.

එහෙත් ස්තුති කිරීමට අවස්ථාවක් නොවිය. ඒ වන විටත් මායා ළමුන් දෙදෙනා එතැනින් පිටව නොපෙනී ගොස් අවසානය.

# 14

හැරී ආපසු හැරී නිවහන බලා ගමන් කරන්නට විය. මඩ වලෙහි ගිලීමෙන් කම්පනයට හා විඩාවට පත්ව සිටි ඔහු වනාන්තරය මැදින් ආපසු ගමන් කළේ සිහිනෙන් ඇවිදිනවාක් මෙනිය.

ඔරලෝසුවකින් වෙලාව නොබැලුවද හොඳහැටි සවස්ව ඇති බව හැරීට වැටහිණ. වනාන්තරයේ හැම දෙසින්ම ඇසෙන්නට වූයේ නිශාචර සතුන් අඳුරට ආසන්න මොහොතේ නගනා හඬවලය.

විශාල වඳුරන් කෑ ගසන හඬද හැරීට ඇසිණ. එහෙත් එය විශාල කැලෑ බළලුන් කෑ ගසන්නාක් සේ නොවීය. වඳුරන්ගේ එම කෑ ගැසීම් ඔවුනොවුන් අතර කරන කතා බහක් වැනි විය.

ගමනේ අවසානයට ළං වෙද්දී ගස් ද අඩුව තිබීම නිසා හැරීට පහසුවෙන් අහස දැක ගැනීමට හැකි විය. අහස පුරාම විදුලි රේඛා ඇඳී මැකී ගියේය. ගිගුරුම් හඬ ද හැරීගේ සවන් වැකිණ.

මොහොතකින් තමාට පියවර කීපයක් ඉදිරියෙන් විශාල වැහි බිඳු ඇද වැටෙනු හැරීට දක්නට ලැබිණ.

වැස්සට තෙමෙමින් සිටීමේ උවමනාවක් හැරීට නොවීය. එපමණක් නොව වැසි දියෙන් පොතුගේ වැටී තැවරුණු මඩද සේදී යනු ඇතැයි ඔහු සිතිය.

මහ වැස්සට තෙමෙන්නට වුවද හැරීට සීතලක් නොවීය.



ඔහුට දැනෙන්නට වූයේ මද උණුසුම් තටාකයක ස්නානය කරන ලෙසකි. එය තරමක සනීපයක් ද විය.

මීදුමක් ගලා එන්නට විය. ගස් කොළන් සොලවමින් සුළඟ හමන්නට විය. සතුන්ගේ හඬ නතර විය. හැරීට ඇසෙන්නට වූයේ වැහි බිඳු ගහ කොළ සහ බිම පතිත වන හඬ පමණකි.

අහස පුරා ඇඳී මැකී යන විදුලි රේඛා ප්‍රමාණය අධික විය. ගිගුරුම් හඬ සහ අහස පුපුරණ හඬ ද එසේමය. එක් අකුණක් පුපුරා ගියේ තමා අසලින්ම බව හැරීට දක්නට ලැබිණ.

හැරීගේ සිත කලබල විය. විශාල මැහෝගනී ගසක් මුල බිම වැතිරෙන්නට ඔහුට සිතිණ. එහෙත් අකුණු පහරකින් බේරෙන්නට එතැන සුදුසු තැනක් නොවන බව ඔහුට වැටහිණ. එනිසාම වැස්සේම ඔහු නිවහන දෙසට ගමන් කළේය.

වැඩි වේලාවක් ගතවෙන්නට පෙර ඔහුට තම නිවහන දිස් විය. මුලදී ඔහු රුචි නොකළ එම නිවහන මේ මොහොතේ ඔහුට පෙනෙන්නට වූයේ සොඳුරු තැනක් ලෙසිනි. ඔහු උඩ පනිමින් එදෙසට දුවන්නට වූයේ ඇඳුම් මාරු කර රසවත් ආහාර වේලකින් සප්පායම් වීමටය.

නිවසට ළඟාවෙත්ම ආලින්දයෙහි මිනිසුන් කීපදෙනකු සිටින අයුරු ඔහුට දක්නට ලැබිණ. ඒ තම දෙමාපියන් සමඟ සේවය කරන තවත් පුරාවිද්‍යාඥයින් පිරිසක් යැයි හැරී සිතිය.

සමහර විට මව ඒ අයට රාත්‍රී ආහාර දීමට කැටුව ආවා විය හැකි යැයිද ඔහුට සිතිණ. එසේ තවත් පිරිසක් සිටීම හොඳය. එවිට පියා ගැන සිතේ ඇති දුක මඳක් හෝ තුරන් වෙනු ඇතැයි ඔහු සිතිය.

හැරී ආලින්දයට ගොඩ විය. ඔහුගේ ඇඳුම් තෙත බත්ව ඇඟට ඇලී තිබිණ. වැහි වතුර සිරුර පුරා බේරෙමින් තිබිණ.

චූටී තිවිත්ස් ඔහු කරා පැමිණියේය.

තිවිත්ස්ගේ මුහුණේ වූයේ ශෝකාතුර පෙනුමකි.

හැරීගේ සිත හිරි ගැස්සිණ. ඔහුට හුස්ම ගැනීම අසීරු විය.

නිවින්ස්ගේ මුහුණ ශෝකාතුල බවෙහි තේරුම තමාට නරක ආරංචියක්.......... තම පියා මිය ගිය බව කියන්නටවත් දැයි හැරිට සිතිණ.

හදවත අධික වේගයකින් ස්පන්දනය වන්නාක් සේ හැරිට දැනෙන්නට විය. ඔහුගේ දෙනෙතින් කඳුළු කඩා හැලෙන්නට විය. ඒ තරමට ඔහු පියාට ආදරේය.

හැරි නිවින්ස් දෙස ප්‍රශ්නාර්ථකාරව බැලීය.

"කනගාටු වුණත් නරක ආරංචියක් කියන්නට තියෙනවා. ඒ ඔයාගේ අම්මා ගැන..."

නිවින්ස් පැවසීය.



# 15

"මො....... මොකද්ද.....? කෝ මගේ අම්මා........?"

හැරි වචන පටලමින් ප්‍රශ්න කළේය.

"එයා ෆ්ලෝරස් රෝහලේ....... ඔයාගේ තාත්තා ඉන්න රෝහලේමයි."

නිවින්ස් කීවේය.

"ඇයි ඒ.....? අම්මාට මොකද වුණේ.....?"

හැරි විමසුවේ කලබලයෙන් මෙන්ම දැඩි කුතුහලයෙනි.

"පර්ඩිලන්ස් සර්පයෙක් දෂ්ට කරලා. ඒ දෂ්ට කළ වෙලාවෙම එයාව හෙලිකොප්ටරයකින් රෝහලට ගෙන ගියා." නිවින්ස් පිළිතුරු දුන්නේය.

පර්ඩිලන්ස් සර්පයා ගැන දෙමාපියන් හැරිට කරුණු කියා දී තිබුණා. පර්ඩිලන්ස් යනු ගෝනමාලාව ඇතුළු මධ්‍යම ඇමෙරිකානු ප්‍රදේශවල සිටින අධික විෂක් සහිත සර්පයෙකි.

වනාන්තරයේ ගමන් බිමන් යද්දී සර්පයින් ගැන දැඩි විමසිල්ලෙන් ගමන් කිරීමට හැරි නිතරම වග බලා ගත්තේය. පර්ඩිලන්ස් සර්පයාගේ ජයාරූප දෙමාපියන් විසින් ඔහුට පෙන්වා දී තිබුණා. ඒ සර්පයාගේ සිරුරේ දුඹුරු පැහැතිය. තල්ල සහ බෙල්ල කහ පැහැති ඌට අති විශාල පෙනයක් ද ඇත.

පර්ඩිලන්ස් සර්පයාගේ ප්‍රධානතම ආහාරය මීයන්ය. එහෙත් මිනිසුන්ට දෂ්ට කර මරා දැමූ අවස්ථාවන් ගැනද හැරී අසා තිබිණ.

තමාගේ මව නිතරම කටයුතු කරනුයේ ඉතා ප්‍රවේශම් සහගතවය. ඇය පර්ඩිලන්ස් සර්පයෙකුගේ ප්‍රහාරයට ලක්වීම හැරීට පුදුමයට කරුණකි.

හැරීගේ සිත තේරුම් ගත්තාක් සේ නිවින්ස් සිද්ධිය විස්තර කරන්නට පටන් ගත්තේය.

"සර්පයා ඉන්න බවක් ඔයාගේ අම්මා දැකල නැහැ. එයා කුහරයකට අත දාලා ගලක් අයින් කරද්දී කුහරයෙ ඇතුලෙ සර්පයා ඉඳල සර්පයා දෂ්ට කරල. අපි විෂ පැතිරෙන්නට බැරි විදිහට දෂ්ට කළ තැනට උඩින් අත වෙලුවා. ඒ ගමන්ම වාගේ හෙලිකොප්ටරය ඇවිත් එයාව රෝහලට ගෙන ගියා. මමත් ඒ එක්කම ගිහිල්ලයි ආවෙ."

නිවින්ස් කිවේය.

"දැන් කොහොමද අම්මාට........?"

හැරී විමසුවේ වෙව්ලන ස්වරූපයෙනි.

"රෝහලට ගෙනියන අතරෙ එයාගෙ සිහිය නැතිවුණා. රෝහලේදී දොස්තරලා එයාට විෂ මර්දන එන්නතක් දුන්නා. දරුණු විෂ තියෙන නාගයෝ මිනිසුන් වැනි ලොකු සතුන්ට දෂ්ට කරද්දි සම්පූර්ණ විෂ ශරීරයට ඇතුල් වෙන්නෙ නැහැ කියලයි දොස්තරලා කියන්නේ. ඒ නිසා ඔයාගේ අම්මාගේ තත්වය ගැන බයවෙන්න එපා කියලා දොස්තරලා කියනවා."

නිවින්ස් පැහැදිලි කළේය.

"මොකද්ද ඒ විෂ මර්දන එන්නත........?"

හැරී ප්‍රශ්න කළේය.

"ඒකත් සර්පයෙකුගේම විෂ අරගෙන නිෂ්පාදනය කළ එකක්ලු."

"ඔයා රෝහලට ගිය වෙලාවෙ මගෙ තාත්තව බලන්නත්



ගියාද......?"

හැරී ඇසුවේය.

"ඔව්...... තාත්තගේ කිසිම වෙනසක් නැහැ. එයා ඉන්නෙ සිහිමුර්ජාවෙන්...."

නිවින්ස් කීවේය.

තම මවත් පියාත් දෙදෙනාම මේ පිටස්තර දේශයේදී මිය යතැයි හැරීට සිතිණ. තමාත් නංගීත් මේ ලෝකයේ අසරණව තනිවෙනු ඇත. සමහරවිට නංගීටත් තමාටත් ජීවත් වෙන්නට සිදුවෙනුයේ එකිනෙකාගෙන් ඈත්ව වෙනත් පවුල් දෙකක් සමග වීමට ඉඩ ඇත.

සමහරවිට තමාට නෑදෑ මිතුරන් නොමැති නගරයක මිය යාමට සිදුවිය හැක. අකැමැති අය සමග එතෙක් ජීවත් වීමට සිදුවිය හැක.

මෙවන් කල්පනාවන් සමග මෙතෙක් ජීවිතයේ ඇති නොවූ තරමේ තනිකමක් සහ අසරණ බවක් හැරීට දැනිණ.

ඒ සමගම තමා අවට මුළු ලෝකයම කැරකෙන්නාක් සේ ඔහුට පෙනෙන්නට විය.

තමා ඇදගෙන වැටෙන්නා සේ ඔහුට වැටහිණ.

නොවැටී සිටින්නට ඔහු ගත් උත්සාහය අසාර්ථක විය.

# 16

හැරි දෙනෙත් හැර බලන විට ඔහු සිටියේ ඔවුන්ගේ නිවසෙහි ඔහුගේ කාමරයෙහි ඇඳ මතය.

"මම හොඳටම බය වුණා. අම්මයි තාත්තයි එන්නම ඔයාවත් රෝහලේ නතර කරන්නට සිද්ධවෙයි කියල."

නිවින්ස් පැවසීය.

"ඇයි මොකද වුණේ___?"

හැරි ඇසුවේය.

"ඔයාට සිහිය නැතිවුණා...."

"කොයිතරම් වෙලාවක් මම සිහිනැතිව හිටියාද___?"

"විනාඩි පහක් විතර. මා ළඟ තිබුණා ඒ වගේ වෙලාවට නහයට අල්ලන කුඩු වගයක්. ඒක ඇල්ලුවාම හරි ගියා."

නිවින්ස් පැවසීය.

ඒ අවස්ථාවේ නිවින්ස්ගේ බිරිඳ වන ජරුන් හැරිට සැන්ඩවිච් සහ සෝඩා ද රැගෙන කාමරයට පැමිණියාය.

ඇඳෙහි වාඩි වූ හැරි ඇය ගෙනා සැන්ඩවිච් පෙති සියල්ලම ඉක්මනටම කා සෝඩා බිවුවේය. ජරුන් නිවින්ස් තවත් සැන්ඩවිච් සහ සෝඩා හැරිට ගෙනවිත් දුන්නේය. හැරි ඒ සියල්ලම අහවර කළේය.



හැරිට රාත්‍රිය ගත කිරීමට තම නිවසනට කැඳවාගෙන යාමට නිවින්ස් යුවල තීරණය කළහ.

"ඔයාට මෙහෙ තනියම ඉන්න බැහැ."

ජරුන් නිවින්ස් කීවාය.

එහෙත් පිට අයගේ නිවෙස්වල රාත්‍රී කාලය ගත කිරීමට හැරි තුළ වූයේ නොකැමැත්තකි.

"බොහොම ස්තුතියි. මම මෙහෙ ඉන්නම්. මොනවා හරි වුවමනා වුණොත් මම ඔයාලගෙ දිහාට එන්නම්."

හැරි නිවින්ස් හට පැවසීය.

එයට ඉඩ දෙනවා හැරෙන්නට නිවින්ස් යුවළට වෙන කළහැකි දෙයක් නොවිය. පසුදින උදයේ දෙමාපියන්ව බැලීමට හැරිව කැටුව යන බව පැවසූ නිවින්ස් යුවළ පිටව ගියහ.

ඔවුන් නික්ම ගිය පසු හැරි මුලින්ම කළේ තෙත ඇඳුම් ගලවා දමා වෙනත් ඇඳුමක් ඇඟ ලා ගැනීමය. නිදා ගැනීමට පළමුව ඔහු ඇඳ ඇතිරිලි ගසා දමා හොඳින් පරීක්ෂා කළේ ගෝනුස්සන්, නාගයින් වැනි සතුන් සිටිදැයි බැලීමටය. එවන් කිසිම සතෙකු ඇඳෙහි නොවිය.

ඒ සියල්ල අවසන් කර ඇඳෙහි වැතිරුණාද නින්ද ඔහු කරා ලං නොවිණ. පසුගිය දිනවල සිදුවූ සියළුම විපත්තීන් ඔහුට යළි යළි සිහිපත් වන්නට විය.

පියා පිරමීඩයෙන් පහළට ඇද වැටිණ. මවට විසකුරු නාගයෙකු දෂ්ට කළේය. තමා මහ වගුරක ගිලෙන්නට ගියේය. ඉදිරියේදී තවත් විපත්ති සිදුවිය හැකි යැයි ඔහුට සිතිණ.

මේ සියල්ලටම හේතුව එකම එක දෙයකි. ඒ හිස්කබල රැගෙන ඒමෙන් මායාවරුන්ගේ ශාපය තමන් වෙත එල්ලවීම යැයි ඔහු සිතීය.

ඇඳේ වැතිර එක දිගටම කල්පනා කරද්දී ඔහුට සිතුණේ මායා රජුගේ හිස්කබල නොගෙනාවේ නම් හොඳය කියාය.

ඒ සමගම තම දෙමාපියන් පැවසූ දෙයක්ද ඔහුගේ මතකයට නැගිණ. ශාපය යන්නෙහි කිසිදු විද්‍යාත්මක පදනමක් නොමැති බව නිතරම ඔවුන් ඔහු සමග පවසා තිබිණ.

ඔවුන්ගේ එම මතය නිවැරදි යැයි හැරී තමාටම කියා ගත්තේය.

එහෙත් සමහර අවස්ථාවල විද්‍යාත්මක හේතු පැහැදිලි කළ නොහැකි දේවල් ද තිබිය හැකි යැයි ඔහු සිතුවේය.

අවසානයේදී ඔහු තීරණය කළේ දෙමාපියන් රෝහලේ සිට නිවසට පැමිණීමෙන් අනතුරුව මායා රජුගේ හිස්කබල ආපසු ගෙන ගොස් තැබීමටය.



# 17

පසුදා උදෑසන හොඳින් හිරු රැස් වැටෙන උණුසුම් එකක් විය. හැරී නිවින්ස් සමග ෆ්ලෝරස් රෝහලට යාමට පිටත් විය. නිවින්ස්ගේ බිරිඳ ද පුරා විද්‍යාඥවරියකි. හැරී සහ නිවින්ස් සමග රෝහල් ගමනට එකතු නොවූ ඇය ගවේෂණ කටයුතු කරන තැන බලා පිටත් වූවාය.

රෝහලේදී දොස්තරවරුන්ගෙන් ලැබුණේ සතුටුදායක පුවතක් නොවේ.

හැරීගේ පියා තවමත් සිහිමුර්ජාවේ පසුවන බවත්, මව යළිත් සිහිසුන් වූ බවත් දොස්තර පැවසීය.

හැරීගේ බඩ පපුව යළිත් උණුසුම් විය. තමාත් නංගීත් අනාථ වන බව යළිත් ඔහුට සිතිණ. ඔහු එම සිතුවිල්ල සිතෙන් අයින්කර ගැනීමට දැඩි උත්සාහයක් දරන්නට විය.

රෝහලෙන් නික්ම ආපසු ටිකෝල් වෙත පැමිණීමෙන් අනතුරුව නිවින්ස් ගවේෂණ කටයුතු කරන තැනට යාමට සූදානම් විය.

"මම වැඩපලට යනවා. ඔයා මොකද කරන්නෙ....?"

ඔහු හැරීගෙන් ඇසීය.

"මම ගෙදරට වෙලා ඉන්නවා."

හැරී පිළිතුරු දුන්නේය.

"කමක් නැහැ. හැබැයි අනම් මනම් මෝඩ වැඩ නම් කරන්න එපා. රෝහලට යන විදිහෙ ජීවා."

අවවාදාත්මකව කියූ නිවින්ස් පිටත්ව ගියේය.

ඔහු නටබුන් පෙදෙස කරා නික්ම යන දෙස හැරි මඳ වේලාවක් බලා සිටියේය.

නිවින්ස් නොපෙනී ගිය පසු හැරි තම ගමන් මල්ලට හිස්කබලත් සැන්ඩ්විච්ස් පෙති කිපයකුත් දමා ගත්තේය. අනතුරුව ඔහු සැගවුණු ලෝකය කරා යාමට පිටත් විය.

ඔහු ජාතික උද්‍යානය අසලට ළඟාවෙන විට මධ්‍යාහ්නයට ආසන්නව තිබිණ. කොට්ටෝරුවෙකු දිරාගිය ගසක බෙනයක් හාරන හඬ ඔහුට ඇසිණ. ඒ සමගම ඔහුට ඇසෙන්නට වූයේ නටබුන් නරඹමින් ගමන් කරන විදේශීය සංචාරකයින්ගේ සහ මග පෙන්වන්නන්ගේ කට හඬවල්ය.

හැරි ගලක නෙළා ඇති මයා රණ විරුවෙකුගේ මුහුණ ඇති තැන පසු කළේය. එම රූපය ඉතා විශාලව නෙළා තිබුණේය. එතැන නතරවී එම රූපය හොඳින් නැරඹීමට හැරිට අවශ්‍ය වුවද ඔහු නතර නොවිණ.

හැකි ඉක්මණින් හිස්කබල තිබූ තැනම ආපසු තැබීමට ඔහුට අවශ්‍ය විය. එය එසේ ආපසු නොතැබුවහොත් තව තවත් අවාසනාවන්ත දේ තමන් කරා ළං වේ යැයි ඔහු සිතීය.

මග පෙන්වන්නෙකු ඇමෙරිකානු සහ බ්‍රිතාන්‍ය සංචාරකයින් පිරිසකට ඉංග්‍රීසි භාෂාවෙන් යමක් විස්තර කර දෙමින් සිටියේය. ඔවුන් සිටියේ ගලින් නෙළා ඇති විශාල ප්‍රතිමා රැසක් ඇති තැනකය.

සැගවුණු ලෝකයට ගොස් ආපසු පැමිණෙන අතර එම විස්තරවලට සවන්දිය යුතු යැයි හැරී සිතීය. එහෙත් ක්‍රිස් කෙලර් නමැති පුරාවිද්‍යාඥයා සහ ඔහුගේ බිරිඳ නටබුන් ගවේෂණ කටයුතු වලදී අවාසනාවන්ත අන්දමින් අනතුරුවලට ගොදුරු වී ඇතැයි මග පෙන්වන්නා පවසනු ඇසෙත්ම හැරී ගමන නතර කළේය. තම මව සහ පියා ගැන සංචාරක මග පෙන්වන්නා පවසන



දේ අසා ගැනීමට ඔහුට සිත් විය.

ඔහු සංචාරකයින්ට තරමක් නුදුරින් නතර විය.

විදේශීය සංචාරකයින් පුදුමයෙන් මෙන් අසා සිටිද්දී ඒ විස්තරය නිමා කළ මග පෙන්වන්නා මායාවරුන්ගේ විශ්මිත ගල් පිළිම නෙළීම ගැන විස්තර කරන්නට පටන් ගත්තේය.

හැරි එතැනින් පිටත්ව යාමට සූදානම් විය. ඒ සමගම කළු රෙදි කඩවල් මුහුණෙහි බැඳගත් තිදෙනෙක් අත්වල තුවක්කු ඔසවාගෙන පඳුරකින් එළියට පැන්නාහ.

ස්පාඤ්ඤ බසින් කෑ ගසමින් ඔවුහු සංචාරකයින් දෙසට තුවක්කු එල්ල කළහ. එනිසාම සංචාරකයින් ආසන්නයෙහි සිටි හැරිටද එතැනින් නික්මෙන්නට ඉඩක් නොලැබිණ.

"මොවුන් මංකොල්ලකාරයෝ....... අපි ළඟ තියෙන මුදල් පසුම්බි ඔවුන් ඉල්ලනවා..."

සංචාරක මග පෙන්වන්නා ඉංග්‍රීසි බසින් සංචාරකයින් හට පැවසීය.

ඉදිරියට ආ මංකොල්ලකරුවෝ මුදල් පසුම්බි දෙන ලෙසට සංචාරකයින් හට සංඥා කළහ.

විනාඩි කිපයක් ගතවෙන්නට පෙර සංචාරකයින් සතුව තිබූ මුදල් පසුම්බි එකතු කරගැනීමට මංකොල්ලකරුවනට හැකි විය. එක් මංකොල්ලකරුවෙකු හැරීගේ කරෙහි එල්ලා ගෙන සිටින ගමන් මල්ල වෙත නෙත් හෙළාගෙන හැරී කරා එන්නට විය.

හැරීගේ හිත බියෙන් පිරිණ. තම ගමන් මල්ලේ ඇති දේ මංකොල්ලකරුට අසු වුවහොත් කුමක් සිදුවේදැයි හැරීට සිතාගත නොහැකි විය.

එනිසාම මේ මිනිසාට ගමන් මල්ල පරීක්ෂා කිරීමට ඉඩ නොදිය යුතු යැයි හැරී සිතීය.

අනෙක් මංකොල්ලකරුවන් දෙදෙනා සිටිනුයේ තමාට පිටුපා බව හැරීට පෙනිණ.

හැරී වෙත එන මංකොල්ලකරුගේ බැල්ම එක එල්ලේම යොමුව තිබුණේ ගමන් මල්ල වෙතය.

මේ අවස්ථාවේ හැරී නිර්භීත පියවරක් ගත්තේය.



# 18

තමා ළඟටම ආ මංකොල්ලකරුගේ පිටුපසින් සිටින යමෙකු සමග සිනාසුණු හැරී ඔහුට සංඥාවක් කළේය. එය ඔහු මංකොල්ලකරු රැවටීමට කළ දෙයකි.

ඔහුගේ උත්සාහය සාර්ථක විය.

හැරී කතා කළ තැනැත්තා කවුරුන්දැයි බැලීමට මංකොල්ලකරු හිස හරවා බැලීය. වහාම ක්‍රියාත්මක වූ හැරී වේගවත් පා පහරක් මංකොල්ලකරගේ දණ හිසට එල්ල කළේය.

"ආ....හ්....."

කෑ ගසමින් බිම වැටුණු මංකොල්ලකරු දෙඅතින්ම දණ හිස බදා ගත්තේය.

හැරී මේ කිසිවක් බලන්නට රැඳී නොසිටියේය. පා පහරක් එල්ල කළ සැනින් ආපසු හැරුණු ඔහු ග්‍රේට් ජ්ලාසා පසුකර කැලෑව තුළ අනෙක් නටඹුන් ඇති පෙදෙසට දිව්වේය.

තම සගයාගේ ළතෝනිය ඇසුණු අනෙක් මංකොල්ලකරුවෝ හැරී ඔහු දෙස බැලූහ. බිම වැටී සිටින තම සගයා හැරෙන්නට වෙනත් කිසිවෙකු ඔවුනට නොපෙනිණ.

ඔවුහු තම සගයාට නැගිට ගන්නට උදව් කළහ. ඔවුහු තිදෙනා එක්ව හැරී ගිය දෙසට ලුහු බැඳ යන්නට වූහ. හැරීගේ පහර කෑ මංකොල්ලකරු දිවුවේ කොර ගසමිනි.

හිස හරවා බැලූ හැටිට ඔවුන් තමාව ලුහු බැඳ එන බව දක්නට ලැබිණ. එනිසාම ඔහු දිවීම තවත් වේගවත් කළේය.

වේගයෙන් දිවයන අතර පය පැකිලුණු හැරී ඇද වැටිණ. ඔහු යළි නැගිටින්නට උත්සාහ කරත්ම ස්පාඤ්ඤ බසින් කෑ ගසමින් දිව එන මංකොල්ලකරුවන්ගේ හඬවල් ළඟ ළඟම ඇසෙන්නට විය.

ඔහු හිස ඔසවා බැලීය. මංකොල්ලකරුවෝ ඉතා ආසන්නයටම ළංව සිටිති.

නැගී සිටින්නට උත්සාහ කළද වැටීමෙන් වලුකට තුවාලදෝ වූ හෙයින් ඔහු යළි ඇද වැටිණ.

ඒ සමගම මංකොල්ලකරුවන් සහ තමන් අතර ඇත්තේ යාර පහක පමණ දුරක් බව හැරීට වැටහිණ. ඔහු තම උලුක්කු වූ විලුඹ තදින් පිරිමැද ගත්තේය. අනතුරුව ඔහු කොණ්ඩි ගසමින් කැලය තුළට යන්නට විය.

මංකොල්ලකරුවන්ගේ පාද වලට පෑගෙන වියළි කොළ අතුවල ශබ්දය හැරීට ඇසෙන්නට විය.

ඔහු කොණ්ඩි ගසමින් අඩි පාරෙන් ඉවත් විය. අලි කන් යනුවෙන් විශාල කොළ වලින් පිරි ගසක් ඔහුට දක්නට ලැබිණ. එහි අතු බිමට පහත්ව තිබිණ.

හැරී එම ගස මුලට රිංගා බිම වැතිරුණේය. අනතුරුව ඔහු දිගු හුස්මක් ඉහළට ගත්තේ සිහිසුන් වීමෙන් වළකින්නටය.

ටික වෙලාවක් ගතවෙද්දී තම අත් දිගේ මොකුන්දෝ දඟලන සෙයක් හැරීට දැනිණ.

එදෙස බැලූ ඔහුට දක්නට ලැබුණේ හමුදා කුහුඹියන් තම අත් දිගේ ඇදෙන බවය. ඔවුන් හමුදා කුහුඹියන් බව දැනගත්තේ පෙර දිනක පොතක තිබූ පිංතූර වගයක මෙම යෝධ කුහුඹියන් දුටු නිසාය.

ඔහුගේ සිතට බියක් දැනිණ. තුවක්කු අතැති දරුණු මිනිස්සු තිදෙනෙකු ඔහුව සොයාගෙන එමින් සිටිති. ඊට අමතරව යෝධ හමුදා කුහුඹියෝ ඔහුගේ සිරුර හරා ඇදෙමින් සිටිති.



මෙම කුහුඹියන් සාමාන්‍ය කුහුඹියන් මෙන් නොවන බව ඔහු පොතෙන් කියවා දැනගෙන තිබිණ. මෙම කුහුඹියන් සපා කැවහොත් ඉතා විශාල තුවාල සෑදෙන බව එම පොතේ සඳහන්ව තිබිණ.

තමා සැඟවී සිටින ගස අසලින් මංකොල්ලකරුවන් ගමන් කරන හඬ හැරීට ඇසිණ. ඔහු අලි කන් වැනි කොළ අතරින් බැලීය.

ඔහු බලා සිටින බව මංකොල්ලකරුවෝ නොදුටුහ. ඔවුන්ගේ සුදානම නිශ්ශබ්දව වනාන්තරයෙන් නික්ම යාම බව හැරීට වැටහිණ. එය නිවැරදිය. ඔවුන් තිදෙනා පෝලිමට වනාන්තරයෙන් පිටතට යන අඩිපාර දිගේ ගමන් කරන්නට වූහ. හැරීගේ පහර කෑ තැනැත්තා ගමන් කළේ කොර ගසමිනි.

තවත් ස්වල්ප වෙලාවක් සැඟවුණු තැනම වැතිර හුන් හැරී ඉන්පසුව අලි කන් කොළ අතරින් පිටතට ආවේ යෝධ කුහුඹියන් සෙමින් ගසා දමමිනි.

ඔහු උලුක්කු වුණාක් සේ කකුලට සිරුරේ බර යොමුකර බැලීය. වැතිර සිටීමෙන් ලද විවේකය නිසා කකුල සුවපත් වූවා සේය. තරමක් කොණ්ඩි ගසමින් වුවද ගමන් කිරීමේ හැකියාව ඔහුට ලැබී තිබිණ.

මංකොල්ලකරුවනට හසුවන්නට ගියේත් තම ගමන් මල්ලේ ගිය්නබල නිසා ඇතිවූ ශාපයෙන් යැයි ඔහු සිතීය.

ඔහු සැඟවුණු ලෝකය හරා වේගයෙන් පිය නගන්නට විය.

# 19

හැරි යළිත් ටිකෝල් නටබුන් පෙදෙස කරා පැමිණියේය.

මංකොල්ලකරුවන් විදේශිකයින්ව කොල්ල කෑ තැන පිරිසක් රැස්ව සිටියහ. ඒ අය අතර පොලිස් නිලධාරීන් දෙදෙනෙකුද සිටිනු හැරිට දක්නට ලැබිණ.

ඔහු ඒ අසලට ළං නොවී ගමන් කරන්නට විය. තමා එතැනට ගියහොත් සිද්ධිය ගැනත් මංකොල්ලකරුවන්ගේ හැඩරුව ගැනත් පොලිස් නිලධාරීන් සමග විස්තර පැවසීමට සිදුවන බව ඔහු සිතිය.

පොලිස් නිලධාරීන්ට සහය වීමට හැරිට තිබුණේ බලවත් කැමැත්තකි. එහෙත් මේ අවස්ථාවේ ඔහුගේ මූලික අවශ්‍යතාවය වූයේ ශාපයේ තවත් විපත්ති පැමිණීමට පෙර හිස්කබල ආපසු තිබූ තැනම තැබීමටය.

වැඩි වේලාවක් ගතවෙන්නට පෙර ඔහු සැඟවුණු ලෝකය කරා ළඟා විය.

ඔහු විශාල පිරමීඩයේ පහතින් ඇති කුහරයෙන් ඇතුලට රිංගුවේය.

පිරමීඩය ඇතුලත සිට ගත් ඔහුට තමාට ඉහළින් කෙඳිරි ගාන්නාත් මෙන් ශබ්දයක් ඇසෙන්නට විය.

ඔහු විදුලි පන්දම දල්වා එදෙසට ආලෝකය එල්ල කළේය. එම ආලෝක දහරාවට කුඩා වවුලන් දෙළොස් දෙනෙකු පමණ දැකගත හැකි විය.



ඔහුට තවත් වවුලන් ගැන විපරම් කරමින් සිටීමට කාලයක් නොවීය. ඔහු මායා රජුගේ සොහොන් ගැබ ඇති පිරමීඩය කරා පිය නැගීය.

දිගු හුස්මක් ගත් ඔහු බෑවුම්කාර පටු ගල් පඩි පෙළ ඉහළට නගින්නට පටන් ගත්තේය.

පිරමීඩය මුදුනට ආසන්න වෙත්ම ඔහු පය තැබූ ගලක් ගැලවිණ. ඉහළින් වූ ගලක් යන්තමින් අල්ලාගත් ඔහු නොමැටී බේරුණේ යාන්තමිනි.

තම පියාට සිදුවූ දේ ඔහුට සිහිපත් විය. දෙපා යළි ගල් පඩියකට වාරුකර ගත්තද බිය නිසා හිතේ ඇතිවූ ගැස්ම අඩු නොවීය. එනිසාම ඔහු විනාඩි කිපයක් හිත සන්සුන් වනතුරු එතැනම රැඳී හුන්නේය.

අනතුරුව ඔහු පෙරටත් වඩා පරිස්සමින් යළි ඉහළට නගින්නට විය.

අවසානයේදී ඔහු පිරමීඩයේ මුදුනටම පිවිසියේය.

හැරි සෙමින් සෙමින් සොහොන් ගැබ තුළට පා නැගීය.

වසර සිය ගණනක් තිබූ අයුරින්ම මායා රජුගේ ඇටසැකිල්ල තිබිණ. අඩුවකට තිබුණේ එහි හිස්කබල පමණකි.

හැරි තම ගමන් මල්ල විවෘත කර හිස්කබල පිටතට ගත්තේය. ඔහු අවසන් වරටත් එම හිස්කබල දෙස බැලීය. මායා රජුගේ ජීවමාන මුහුණ තමා දෙස කෝපයෙන් රවාගෙන සිටින්නාක් සේ හැරිට මැවී පෙනිණ.

"මට සමාවෙන්න.......... මම දැන් ඔබව ආපසු තියනවා. කරුණාකර මගේ දෙමාපියන්ව සුවපත් කරන්න."

හැරි සෙමින් පැවසීය.

තමා හිස්කබලට එසේ පැවසීම මෝඩ ක්‍රියාවක් යැයි ඔහුට සිතිණ. එහෙත් එය ඇසෙන්නට තරම් ළඟ පාතක කිසිවෙකු නොමැතිවීම ඔහුට සහනයක් විය.

අනතුරුව ඔහු හිස්කබල තිබූ අයුරින්ම සැන්පත් කළේය. ඊළඟට ඔහු ඇටකටු අසල ඇති ආභරණ වෙත විදුලි පන්දම එල්ල කළේය.

වල් තාරා හිසක ස්වරූපයේ මැණික් කැල්ල ඔහුගේ නෙත ගැටිණ. එය අතට ගත් ඔහු ඒ මේ අත හරවමින් බැලීය.

අනතුරුව එය ආපසු තැබූ ඔහු සොහොන් ගැබෙන් පිටව ඉතාමත් ප්‍රවේශමෙන් භයානක ගල් පඩි පෙළිය ඔස්සේ ආපසු පිරමීඩයෙන් පහතට බැස්සේය.

මායා රජුගේ හිස්කබල ආපසු තිබූ තැනම තැබීමෙන් පසු තමා විශාල බැඳීමකින් මිදුණේය යන හැඟීම ඔහුට ඇති විය.

ඒ සමගම රුදුරු ශාපයද අවසාන යැයි ඔහුට සිතිණ.



# 20

හැරී නිවහනට ළඟාවෙන විට හිරු බැස යාමට ඉතාමත් ආසන්නව තිබිණ.

තමා පැමිණෙන තුරු නිව්න්ස් යුවල මඟ බලා සිටිනු දැකීම ඔහුට පුදුමයට හේතුවක් විය. ඔවුන් දෙදෙනාගේ මුහුණුවල රැඳී තිබුණේ මායාවේ පිරමීඩ වලටත් වඩා විශාල සිනහවක් ය.

"ඉතාමත් සුවිශේෂී පණිවිඩයක් කියන්න තියෙනවා."

දුර සිටම නිව්න්ස් පැවසීය.

හැරී හැකි ඉක්මනින් නිව්න්ස් යුවල අසලට ළඟා විය.

"ඔයාගෙ අම්මටයි තාත්තටයි දැන් හොඳයි. ඔව් හොඳටම සනීපයි. හෙට ඒ දෙන්නාම රෝහලෙන් එක් කරගෙන එන්න පුළුවන්."

නිව්න්ස් පැවසීය.

"ඇත්තටමද......?"

හැරී ඇසුවේ පුදුමයට පත්වූ අයුරිනි.

ඇත්තෙන්ම එම පුවත හැරීට විශ්වාස කළ නොහෙන තරම්ය. දැඩි සේ නිලන්ව සිහිසුන්ව හුන් තම දෙමාපියන් පැය කිහිපයක් ඇතුළත මුළුමනින්ම සුවපත්ව සිටින බව ඔහු කෙසේ විශ්වාස කරන්නද....?

"ඔව්... ඇත්තටම එයාලට සනීපයි. දැන් ඒක වෙලාවකට ඉස්සරවෙලා චූටි දොස්තරට ටෙලිෆෝන් කළා. ඔයාගේ අම්මටයි තාත්තටයි මේ තරම් ඉක්මනට සනීප වුණ එක එයාලටත් පුදුමයිලු. එහෙන් එයාලට අදහගන්න බැරි දේලු දෙන්නටම එකම වෙලාවටම සනීප වුණු එක..."

නිවන්ස්ගේ ඔච්චිද වන ග්‍රැයින් පැවසුවාය.

"අනේ... සියමයිනෙ.."

හැරී පැවසුවේ සතුටු උන්මාදයෙනි.

සතුටු කඳුළු හැරීගේ දෙනෙතින් කඩා හැළෙන්නට විය.

දැන් සියල්ලම අවසන්ය. තමාත් නංගීත් අනාථ දරුවන් නොවනු ඇත. තොයිම අයුරකින්වත් තමන් දෙදෙනා වෙන් නොවනු ඇත... ඔහු සිතීය.

සිදුව ඇති සුවපත් වීම දොස්තරලාට පුදුමයට කරුණක් වුවද සිදුවූයේ කුමක්දැයි දන්නේ හැරීය. ඔවුන් ඇත්තෙන්ම ලක්ව සිටියේ ශාපයට යැයි හැරීගේ තීරණය විය. දැන් ඒ සියල්ල අවසන්ය.

තමා නිස්කලඹ ආපසු තඩා වැඩි වෙලාවක් ගතවෙන්නට පෙර දෙමාපියන් සුවපත් වූ බව ඔහු සිතීය.

"මම හෙට උදේ ඒ දෙන්නා එක් කරගෙන එන්න රෝහලට යනවා... ඔයත් එනවද....?"

චූටි නිවන්ස් හැරීගෙන් ඇසීය.

"ඔව්.... එයාලත් එක්ක කතා කරන තුරු මට ඉවසුමක් නැහැ."

හැරී කීවේය.

හැරී රාත්‍රී ආහාර ගත්තේ නිවන්ස්ලා සමග ඔවුනගේ නිවසෙහිදීය. රාත්‍රිය එහි ගතකරන ලෙසට නිවන්ස් යුවල හැරීට ඇරයුම් කළද හැරී එයට එකඟ නොවීය.



ඔවුන්ගෙන් සමුගත් හැරී තම නිවසත කරා පිය නැඟීය.

නිදාගන්නට සූදානම් වූ ඔහු ඇඳ යටත්, උඩත් හොඳින් පරීක්ෂා කර බැලීය. අනතුරුව භූමිතෙල් ලාම්පුව නිවා දමා ඇඳෙහි වැතිරුණේය.

වැඩි වෙලාවක් ගත නොවිණ. නිවසෙහි සාලය දෙසින් යම් ශබ්දයක් ඇසිණ.

වහාම ඇඳ මත වාඩි වුවද ඇඳෙන් බිමට බැසීමට තරම් හිතේ වෙරත් ඔහුට නොවීය. තම හදවත වේගයෙන් ගැහෙන හඬ ඔහුට ඇසෙන්නට විය.

යළිත් ඔහුට මුලින් ඇසුණු හඬ ඇසිණ. එය කිසිවෙකු ඇවිදින වැනි හඬකි.

ලාම්පුව මේසය මතින් බිමට පෙරළිණ.

කවුරුන් හෝ නිවසන තුළට ඇතුල් වී ඇති බව ඔහුට වැටහිණ.

හැරීගේ හදවතේ ගැස්ම තවත් වේගවත් විය.

"මම මොකද කරන්නේ....? මම හයියෙන් කෑ ගැහුවොත් හොරා යයිද.....? එහෙම නැතිනම් මම කාමරයෙම හැංගිලා ඉන්නවාද........?"

ඔහු තමාගෙන්ම ප්‍රශ්න කළේය.

පියා මේ අවස්ථාවේ නිවසෙහි සිටින්නේ නම් කෙතරම් හොඳ දැයි ඔහු සිතීය.

සහමුලින්ම ශාපය පහව ගියේ නැතිදැයි ඔහු කල්පනා කරන්නට විය.

සාලය තුළින් නැවතත් හෙමින් හෙමින් පියවර තබන හඬක් ඔහුට ඇසිණ.

අඳුරේම ඇඳෙන් බැස ගත් ඔහු තම ගමන් මල්ල සොයාගෙන එතුළින් විදුලි පන්දම පිටතට ගත්තේය.

ඒ සමගම කාමරයේ දොර අසල තිබූ කොස්ස ඔහුට දකින්නට ලැබිණ.

ප්‍රමාණවත් නොවුණද මේ අවස්ථාවෙහි හැටියට ඔහුට එය ආයුධයක් විය.

මඩෙහි ගිලී මිය යාමට ආසන්න වූ අවස්ථාවේ මෙන්ම දැඩි බියක් ඔහුට දැනෙන්නට විය.

කඩුවක් මෙන් එක අතකින් කොස්ස ඔසවා ගත් ඔහු අනෙක් අතින් විදුලි පන්දම ගෙන කාමරයෙන් පිටතට පා තබන්නට විය.

"කවුද ඉන්නේ.......?"

කටහඬ රළු කර ගැනීමට උත්සාහ කරමින් හැරී කෑ ගැසීය.



# 21

කිසිම ශබ්දයක් නොනැගිණ.

හැරී සාලය පුරාම විදුලි පන්දම් එළිය එල්ල කරමින් පරීක්ෂා කර බැලීය.

කිසිවෙකු දක්නට නොවිය.

ඔහු කොස්ස සූදානමින් තබාගෙන සාලයට ඇතුල් විය.

"හැංගිලා ඉන්න කෙනෙක් එළියට එන්න......"

ඔහු උස් හඬින් කීවේය.

ඔහුගේ දෙඅත් ද වෙව්ලමින් තිබිණ. එනිසාම ඔහුට කොස්සත්, විදුලි පන්දමත් බිම නොවැටී තබා ගැනීමට දැඩි ආයාසයක් දැරීමට සිදුවිය.

ඔහු දණ ගසා සෝපාව යටත්, මේසය යටත් විදුලි පන්දම් එළියෙන් පරීක්ෂාකර බැලීය. එහෙත් කිසිවෙකු හෝ දක්නට නොවීය.

කෙලවර කුඩා මේසය මත තබා තිබූ ලාම්පුව එතැනම බිම වැටී පෙරළී ඇති අයුරු හැරීට දක්නට ලැබිණ.

"ඒ.......ර්.......ක්.......යා......."

ඔහුට කෑ ගැසිණ.

හැරි දෙසට කළු ඇස් දෙකක් එල්ල වී තිබිණ. ඔහු හුස්ම තදින් අල්ලා ගත්තේය. ඔහුට ආපසු හැරී දුවන්නට සිතුනද ඊට පෙර ඔහු මේසය යට රැඳී සිටින ගොදුරු සොයන්නා දෙස හොඳින් බැලීය.

ඒ කොන්ට්මුන්ඩියෙකි. දිග කළු කොමඩත් බුල් පිරුණු වලිගයත් නිසා හැරිට ඌව පහසුවෙන්ම හඳුනාගත හැකි විය. කොන්ට්මුන්ඩියා හැරි දෙස බලා සිටියේ බියපත් දෙනෙතකිනි.

හැරි දිගු සුසුමක් හෙළා ළය සැහැල්ලු කර ගත්තේය. ඒ එම සතා හොඳින්ම දන්නා නිසාය. ඒ සතා නිවහන තුළට පැමිණෙන්නට ඇත්තේ රෑ කෑමට යමක් සොයාගෙන විය යුතුය.

හැරි පිටුපස දොර වෙත ගොස් එය විවෘත කළේය. අනතුරුව ඔහු සතාව කොස්සෙන් තල්ලුකර ගෙයින් පිටතට යැවීමට උත්සාහ කළේය.

කොන්ට්මුන්ඩියා මේසය යටින් පිටතට ආවද හැරි බලාපොරොත්තු වූ පරිදි ඌ ගෙයින් පිටතට ගියේ නැත. ඒ වෙනුවට ඌ කුස්සියට රිංගා ගත්තේය.

ඌව කුස්සියෙන් පිටතට පන්නා දැමීමට හැරිට දැඩි වෙහෙසක් දරන්නට සිදු විය.

අවසානයේදී පැය භාගයකට පමණ පසුව ඌව ගෙයින් පිටතට එළවා ගැනීමට හැරි සමත් විය.

නිවහනෙන් පිටවූ සතා අඳුර අතරින් නොපෙනී ගියේය.

දොර වසා දමා කාමරයට ගිය හැරි ඇඳේ දිගාවෙන්නට පෙර යළිත් වරක් ඇනිරිලි ගසා දමා පරීක්ෂා කළේය.

පසුදින බූඩ් නිවින්ස් පැමිණ දොරට තට්ටු කළේය.

"හැරි රෝහලට යන්න ලෑස්තිද.....?"

ඔහු ඇසීය.

"ඔව්."

ඒ වන විටත් සූදානම්ව සිටි හැරි පැවසීය.



# 22

තම මවත් පියාත් රෝහලෙහි ආලින්දයෙහි සිටින අයුරු හැරි දුර තියාම දුටුවේය.

"අම්මේ...... තාත්තේ......"

හැරි සතුටින් කෑ ගසමින් ඔවුන් කරා දිව ගියේය.

මවත් පියාත් හැරීව බදා ගත්හ.

හැරිගේ මවගෙන් නම් කිසිදු වෙනස්කමක් දැක ගැනීමට නොතිබිණ. එහෙත් පියා කෙට්ටු වී සුදුමැලිව සිටියේය. ඔහුගේ කට හඬෙහි පවා වෙව්ලන ස්වරූපයක් විය.

බූඩ් නිවින්ස්ගේ රථයෙන් ඔවුහු ටිකෝල් බලා පිටත් වූහ. තමන් රෝහල් ගතව සිටි කාලය තුළ හැරි කෙළේ මොනවාදැයි දෙමාපියෝ හැරිගෙන් ඇසූහ.

පෙරදින රාත්‍රියේ පැමිණි උඩයක්කරු ගැන විස්තරය හැරි පැවසීය. ඒ ඇසූ සියළු දෙනාම ඇති පදම් සිනාසුණහ. මායා ශාපය ගැනත් තමා ලද අත්දැකීම් ගැනත් දෙමාපියන් සමඟ පමණක් පැවසීමට හැරි සිතාගෙන සිටි හෙයින් නිවින්ස් සිටින නිසා හැරි ඒ ගැන කිසිවක් නොකීවේය.

පසුදින සිට යළි ගවේෂණ කටයුතුවල නොයෙදී, හැකි ඉක්මණින් ටිකෝල් වලින් පිටව යාමට දෙමාපියන් තීරණය කර තිබිණ.

"ආ..... ඒකට කමක් නැහැ....."

එම තීරණය ගැන ඇසූ නිව්න්ස් පැවසිය.

"තව සෑහෙන පිරිසක් එකතු කරගෙන කළත් වැහි කාලයට ඉස්සරින් මේ කැණීම් කටයුතු ඉවර කරන්න බැහැ. ඒ නිසා වැහි කාලයෙන් පස්සෙ අපට මාස කීපයක් මේ වැඩවල යෙදෙන්නට වෙයි. වැහි කාලයත් අත ළඟම නිසා දැන් ඔයාලා ආපසු ගියාට කමක් නැහැ."

නිව්න්ස් වැඩි දුරටත් පැවසිය.

"මේ ගවේෂණයෙන් වුණේ නාගයෙක් දෂ්ට කළ එක විතරයි."

හැරීගේ මව පැවසුවාය.

ඇයගේ විහිළුවට හැමෝම සිනාසුණාහ.

"අපි ආපසු ගියාට කමක් නැහැ කියල ඔබ හිතනව නම්, අපි තව දවස් දෙකකින් ආපසු ගමට යන්නම්. එහෙම වුණොත් අපට විවේකීව බෙහෙත් ගන්න පුළුවන්."

හැරීගේ පියා නිව්න්ස් හට පැවසිය.

හැරීලා නිවහනට ළඟා වූ පසු ටික වේලාවක් ඔවුන් සමග රැඳී සිට නිව්න්ස් ඔවුන්ගෙන් සමුගෙන කැණීම් කටයුතු කරන ස්ථානය බලා පිටත්ව ගියේය.

ඔහු නික්ම ගිය පසු තමා මඩෙහි ගිලුණු කතාව සහ මංකොල්ලකරුවන් සමග කළ ගනුදෙනුව හැරී දෙමාපියන් සමග කීවේය.

"අම්මෝ...... ඇති... හැරී... කරදරයක් අනතුරක් නොවී ඔයා බේරිලා තියෙන්නේ වාසනාවකින්."

මව පැවසුවාය.

"ඒක ඇත්ත. ඒත් මේ හැම දෙයක්ම සිද්ධ වුණේ මායාවරුන්ගේ ශාපය නිසා කියලයි මම හිතන්නේ. ඒකෙන් තමා නාක්කාට තුවාල වුණේ. ඒ වගේම අම්මාගේ අත සර්පයා කෑවෙත් ඒ ශාපය නිසා කියලයි මම හිතන්නෙ."



හැරී කීවේය.

දෙමාපියෝ හොක්හඬලා සිනාසුණාහ.

"හැරී මම ඔයාට කියලා තියෙන්නේ ශාපය කියලා දෙයක් නැහැ කියලා. මම නැග්ග පිරමිඩේ බෑවුම වැඩියි. ඒ හින්දයි මම ලිස්සලා වැටුණෙ. අනිත් එක ඔය මම වැටුණු පළවෙනි වතාව නෙවෙයි. ඒ වගේම ඒක අන්තිම වතාව වෙන්නෙත් නැතිවෙයි."

පියා පැවසිය.

"හොඳයි... එතකොට අම්මගෙ අත කොහොමද සර්පයෙක් කෑවෙ......?"

හැරී ප්‍රශ්න කළේය.

"කැලෑවල්වල නිතරම තියෙන අනතුරක් තමයි නාගයින්. අර කුහරයේ හිටිය නාගයා මට නැතත් අපෙ කණ්ඩායමේ වෙන කෙනෙකුට හරි දෂ්ට කරනවා. ඒ අවස්ථාවෙ හැටියට..."

මව පිළිතුරු දුන්නාය.

"ඒත් තව එක දෙයක් තියෙනවා. මම හිස්කබල අරගත්තු තැනම ආපසු ගිහින් තියනවාත් එක්කම ඔය දෙන්නටම එකවරම සනීප වුණා. ඒක මගේ ගමන් මල්ලෙ තියෙන තුරුම ඔයාලට සනීප වුණේ නැහැ."

හැරී පැවසුවේ තර්ක කරන්නාක් මෙනි.

"ඒක නම් හරිම අදහාගන්න බැරි දෙයක් තමා. ඒත් අපි දෙන්නා සනීප වුණේ හොඳ වෛද්‍ය ප්‍රතිකාර නිසයි. මොන දේ වුණත් ඔයා ඔය ශාප ගැන තියෙන සිතුවිල්ල හිතෙන් අයින් කර ගන්න."

පියා උපදෙස් දෙමින් පැවසිය.

ඉන්පසු තවත් දින දෙකකින් පිටත්ව යාම සඳහා හැරීගේ දෙමාපියන් බඩු මුට්ටු අස්පස් කරන්නට පටන් ගත්හ.

සවස් වෙත්ම හැමදෙනාගේම කටයුතු අවසන් විය.

දෙමාපියන් විවේක ගැනීමට කාමරයට ගිය අතර හැරී ආලින්දයේ එල්ලා ඇති වැල් ඇඳේ දිගා වුණේය.

අන්ධකාරය ළං වෙත්ම අකුණු පුපුරන්නට පටන් ගැනිණ. මොහොතකින් ධාරානිපාත වර්ෂාව ඇද හැලෙන්නට පටන් ගැනිණ. වැහි සමය ඇරඹිණි යයි හැරීට සිතිණ. තම දෙමාපියන් මෙන්ම අනෙක් පුරා විද්‍යාඥයින්ද ආපසු ගම් රටවල් කරා යාමට පටන් ගනු ඇත.

හැරී විදුලි අකුණු කොටමින් වැස්ස ඇද හැලෙන දෙස බොහෝ වේලාවක් බලා හුන්නේය.

ශාපය නිසා දෙයක් නොවන බවට තම දෙමාපියන් පැවසීම ගැන හැරී සිතන්නට විය.

එහෙත් වැඩිදුර සිතන්නට පෙර මවගේ කට හඬින් ඔහුගේ කල්පනා ලොව බිඳ වැටිණ.

"අපි අනිද්දා උදේම මෙහෙන් පිටවෙලා යනවා. ඔයාගෙ නංගියි යාළුවොයි ඉක්මනට ආපසු දකින්නට ලැබෙන එක ගැන ඔයා සතුටුයි නේද...?"

මව ඇසුවාය.

"ඔව්... එහෙම තමා මම හිතන්නෙ..."

හැරී පිළිතුරු දුන්නේ උදාසීනවය.

හැරී මෙහි පැමිණි පළමු දිනයේම සිතුවේ හැකි ඉක්මනින් ආපසු යාමටය. එහෙත් දැන් ඔහුට සිතෙනුයේ ආපසු යාමට පෙර ඉටු කළයුතු විශේෂ කටයුත්තක් තමාට වී ඇති බවය.

ආපසු යාමට පෙර ශාපය ගැන නිරවුල්වම දැනගෙන යා යුතු යැයි ඔහු සිතීය.



# 23

හැරී පසුදින අවදි වූයේ තමා ටිකෝල් හි ගතකරන අවසාන සම්පූර්ණ දිනය උදා වූ බව සිතමිනි.

එහෙත් ආපසු යාමට පෙර දැනගත යුතු සුවිශේෂ දෙයක් ඔහුගේ සිත තුළ කැකෑරෙමින් තිබිණ.

උදේ ආහාරයෙන් පසු ටිකෝල් පෙදෙසේ අවසාන වතාවටත් තමා ඇවිදින්නට යන බව ඔහු දෙමාපියනට පැවසීය. එහෙත් තමා සැඟවුණු ලෝකය දෙසට යන බව ඔහු දෙමාපියනට වසන් කළේය.

තමා එහි යන්නේ කුමකටදැයි ඔහුම නොදන්නේය. එහෙත් එහි යා යුත්තේ ඇත්තෙන්ම ශාපය ඇතිදැයි බැලීමට යැයි ඔහු සිතන්නට උත්සාහ කළේය.

ගෙන යාමට ඇවැසි සියළු දෙයම ගමන් මල්ලෙහි දමා එය කරෙහි එල්ලා ගත් හැරී ගමන් ඇරඹීය.

සෙමින් සෙමින් ගමන් කළ ඔහු සැඟවුණු ලෝකය පෙදෙසට ළඟා විය.

කිසිවෙකු පෙනෙන තෙක් මානයක නොවීය. ප්‍රධාන පිරමීඩය අසලට ළං වූ ඔහු එහි පහත ඇති කුහරයෙන් ඇතුළට රිංගීය.

එම පිරමීඩය තුළට ඇතුල් වූ ඔහු මායා රජුගේ සොහොන් ගැබ ඇති පිරමීඩය සොයා ගනු පිණිස විදුලි පන්දම දල්වා බැලීය.

අනතුරුව ඔහු ඉතාමත් කල්පනාකාරීව ඉතා සෙමින් එම පිරමිඩයේ ඉහළට ඇති ගල් පඩි නගින්නට විය.

ඉහළටම නැගුණු ඔහු සොහොන් ගැබ වෙත පා තබන්නට විය.

ඔහු තම විදුලි පන්දම ඉදිරියට එල්ල කළේය.

ඒ සමගම තම දෙපා අතර දැවටෙමින් යමෙක් හැ ගසන හඬ ඔහුට ඇසිණ.

වහාම උඩ පැන්න ඔහු විදුලි පන්දම් එළිය දෙපා දෙසට යොමු කළේය.

කකුල්වල දැවටුණේ මීයන් රැසක් බව ඔහුට පෙනිණ.

ඔහු ඇටසැකිල්ල ඇති තැන වෙත විදුලි පන්දම් එළිය යොමු කළේය. ඇටසැකිල්ල නැගිට ඇවිදිනු ඇතැයි ඔහු සිතීය. එහෙත් එය තිබූ අයුරින්ම තිබිණ. එම ඇටසැකිල්ලේ ගෙලට ඉහළින් තමා තැබූ අයුරින්ම හිස්කබල තිබෙන බවද ඔහුට පෙනිණ.

හැම දෙයකම වෙනසක් නැත. ශාපය යනු බොරුවක් බවට මවත් පියාත් පැවසූ වග සැබෑ බව හැරීට සිතිණ.

ඔහු තම විදුලි පන්දම් ආලෝකය ආභරණ වෙත යොමු කළේය. ඒවා විදුලි පන්දම් ආලෝකයෙන් දිලිසෙන්නට විය. වල් නාරා මුහුණෙන් ඇති කෑල්ල ඔහුගේ නෙතු දැවටිණ.

එය අතට ගත් ඔහු මුහුණට ළංකර බැලීය. එය පැරණි මුවද අලංකාරය. අවුරුදු ගණනාවකට පෙර එය පැළඳ ගත් මායා රජෙකු තමන් ඉදිරිපිට සිටින සෙයක් ඔහුට මැවී පෙනිණ.

හැරී එම වල් නාරා හිස වැනි මැණික අත ගෑවේය. තමා මායා රජෙකුගේ ඇටසැකිලි දුටු බවට සාක්ෂියක් ලෙස පෙන්වීමට මෙම වල් නාරා හිසක් වැනි පෙන්ඩනය රැගෙන ගියහොත් හොඳ යැයි හැරීට සිතිණ.

එවන් සාක්ෂියක් නොතිබුණොත් තමා පවසන කතන්දර මිතුරන් විශ්වාස නොකරනු ඇතැයිද ඔහු සිතීය.



ඔහු නැවත වරක් පෙන්ඩනය පරීක්ෂාකර බැලීය. අනතුරුව එය තම සාක්කුවට දමා ගත්තේය. අනතුරුව ඔහු මොහොතක් සිටගෙන බලාගෙන සිටියේ අසාමාන්‍ය දෙයක් සිදුවේදැයි දැන ගැනීමටය.

කිසිවක් සිදු නොවිණ. විදුලි වේඩා නැගුණේ නැත. අකුණු පිපිරුණේ නැත. පිරමිඩයේ පඩිපෙළ කඩා වැටුණේ නැත.

"ශාපය කියන්නේ බොරුවක්. මම මේක අරගෙන යනවා."

ඔහු තමාටම කියා ගත්තේය.

# 24

හැරී පිරමීඩයෙන් පහළට බසිද්දී ගල් පඩිවල පා තැබුවේ පෙර වතාවල් වලට වඩා බෙහෙවින් පරිස්සමිනි.

කිසිදු අමුත්තක් සිදු නොවිණ. පිරමීඩයෙන් පහළට බැස ගත් පසු ඔහුගේ සිතට සැහැල්ලුවක් දැනිණ.

ශාපය කියා දෙයක් තිබුණේ නම්, තමා පිරමීඩයෙන් පහළට ඇද වැටීමට තිබුණු බව ඔහුට සිතිණ. ඔහු සාක්කුව අත ගා බැලීය. වල් තාරා හිසක් වැනි පෙන්ඩනය සාක්කුවේ තිබෙන බව ඔහුට සහතික විය.

අවසාන වතාවටත් ඔහු විශාල පිරමීඩයේ පහත කුහරයෙන් රිංගා පිටතට ආවේය. දහවල් හිරු එළිය ඔහුගේ සිරුරෙහි දැවටිණ.

කැමති අයුරකින් සවස් කාලය ගත කිරීමට ඔහුට අවස්ථාව තිබිණ. ටිකෝල් හි විශාලම පිරමීඩය වන හයවන දේවස්ථානය කරා යාමට ඔහු තීරණය කළේය.

පළමුව වම් පැත්තට ගොස් අනතුරුව බටහිරට ගමන් කිරීමෙන් හයවන දේවස්ථානයට යා යුතු විය. පුරා විද්‍යාඥයින් පවසන පරිදි එය සියවස් දොළහක් ඉපැරණි දේවස්ථානයකි.

බොහෝ විදේශිකයෝ මෙම පිරමීඩය මතට නැගීමට බෙහෙවින් රුචි කළහ. ඒ ටිකෝල් හි උසම පිරමීඩයට නැගි බවට ඔවුනට පැවසිය හැකි නිසාය.



හැරීගේ උවමනාවද එයම විය.

අනෙක් ඒවා මෙන් නොව හයවන දේවස්ථානය නැගීමට අසීරු පිරමීඩයකි. අනෙක් ඒවායේ ඉහළට නැගීමට පඩිපෙළ වල් තිබිණ. එහෙත් හයවන දේවස්ථානයේ ඉහළට නැගීමේදී ගස් වැල් වල එල්ලී යාමටද අවශ්‍යය.

හැරීට එම පිරමීඩය මතට නැගීම ත්‍රාසජනක මෙන්ම විනෝදජනක එකක් ද විය.

එම අභිප්‍රාය ඉටු කරගෙන හයවන දේවස්ථානයෙන් පහළට බට හැරීට ඊළඟට කළ යුත්තේ කුමක්දැයි වැටහීමක් නොවිය.

මද වේලාවක් කල්පනා කළ ඔහු තීරණය කළේ ආපසු නිවහනට ගොස් බඩු මුට්ටු ලක ලෑස්ති කිරීමට උදව් කිරීමටය.

ආපසු යන අතර ටිකෝල් හි ඇති මායා පිළිම ආදියද නරඹා යන අදහසින් ඔහු එම ගලින් නෙලූ විශාල ප්‍රතිමා ඇති පෙදෙස කරා ගමන් කළේය.

ඒ යන අතර ඔහුට ගසක වැසූ කුරුල්ලෙකු එම ගසේ අතුවල ඇති ගෙඩි වර්ගයක් ගෙන කන අයුරු දක්නට ලැබිණ. ඔහු කුරුල්ලා ආහාර ගන්නා දෙස බලා හුන්නේය.

ඒ අතර එම ගසෙහි සමහර ගෙඩි කුරුල්ලාගෙන් ගිලිහී බිම වැටෙන අයුරු ඔහුට දක්නට ලැබිණ. ඔහු ගස මුලට ගොස් එයින් ගෙඩියක් ඇහිද ගත්තේය.

එම ගෙඩිය ඇපල් ගෙඩියක් තරම් එකකි. එහෙත් එම ගෙඩි හැරී මීට පෙර දැක නොතිබිණ. ඔහු දත් වලින් පොත්ත ඉවත්කර ඇතුළත කෑල්ලක් දතින් කඩාගෙන කෑවේය.

"වරදක් නැහැ."

ඔහු තමාටම කියා ගත්තේය.

තව තවත් ගෙඩි අහුලා ගත් ඔහු ඒවා කෑවේය. කුසගින්න සම්පූර්ණයෙන් පහ නොවූවද නිවසට යනතුරු එම ආහාරය සෑහේ යැයි ඔහු සිතීය.

යළි ගමන් ආරම්භ කළ ඔහුට මඳ දුරක් යද්දී වෙනසක් දැනෙන්නට විය. හැම දෙයක්ම පෙනෙන්නට වූයේ අපැහැදිලිවය. ඔහුට උණ ගතියක් දැනෙන්ට විය. තමා සිටිනුයේ කොහේදැයි කියා ඔහුට නිවැරදි වැටහීමක් නොවිය.

තම මුළු සිරුරම දැවෙන්නාක් සේ ඔහුට දැනෙන්නට විය. ගසක් මුල සෙවනට වී ටික වේලාවක් සිටියද එම ගිනියම අඩු නොවිය.

ඔහුගේ දෙනෙත් කසන්නට විය. දෙඅත්ලෙන් දෙනෙත් පිරිමැද ගනිද්දී ඒ කැසීම තවත් වැඩි විය.

දිව වේලී ගිලෙන්නට මෙන් විය. යම්කිසි දෙයක් උගුරේ සිරවී ඇති සෙයක් ඔහුට දැනිණ.

"මම ආපසු නිවහනට යන්න ඕන."

ඔහු තමාටම කියා ගත්තේය.

තමා කොහේදෝ තැනක අතරමංව සිටින සෙයක් ඔහුට හැඟිණ. ඔහු බිම වාඩි විය.

ඔහුගේ මුළු මුහුණම කසන්නට විය. ඒ විශාල දැවිල්ලෙකුත් සමගය.

ඔහු තමා ගෙඩි කෑ ගස දෙසට බඩගාමින් ඇදෙන්නට උත්සාහ කළේය.



# 25

තමා සිහිනයක් දකින්නේ යැයි හැරීට සිතිණ.

අපැහැදිලි ඡායාවක් සේ පියා තමා දෙසට එබී බලා සිටින අයුරු ඔහුට පෙනිණ.

පියා යමක් තමාගෙන් අසනු ඇසිණි ද පිළිතුරක් දීමට ඔහුගේ මුවෙන් ශබ්ද පිට නොවිණ. පිළිතුරක් දීමට උත්සාහ කළද එය අසාර්ථක විය.

ඔහුගේ නෙත් බාගෙට පියවී විකාර දේ ඔහුට පෙනෙන්නට විය. විවිධ වර්ණ.... ගී ගයන පිරිමින්____ දේවස්ථාන____ පිරමිඩ සහ නටන ඇටසැකිලි ඔහුට පෙනෙන්නට විය. තමා වෙව්ලන්නාක් සේ ඔහුට දැනෙන්නට විය.

විශාල උත්සාහයකින් ඔහු දෙනෙත් විවෘත කළේය. තමා දෙස එබී බලාගෙන සිටින පියාගේ මුහුණ අපැහැදිලිව ඔහුට දක්නට ලැබිණ.

"හැරී මොකද වුණේ____"

පියා ඔහුගෙන් ඇසීය.

හැරී දෙනෙත් කරකවමින් වටපිට බැලීය. ඔහු ඒ වෙන විටත් සිටියේ තමා නොදන්නා ගෙඩි ඇති ගස පා මුලය. හිරු බැස යමින් තිබිණ.

පියාට යමක් කීමට හැරී උත්සාහ කළද එය නොහැකි විය.

දිව ගිලී තිබීම නිසා ඔහුගේ මුවෙන් පිටවුයේ කෙඳිරිල්ලක් පමණි.

හැරීව නැගිටුවන්නට පියා උත්සාහ කළේය. එහෙත් පියාගේ වාරුවෙන් සිට ගත්තද හැරීගේ දණ හිස් වෙව්ලන්නට පටන් ගැනිණ.

පියා හැරීව වත්තන්කර ගත්තේය. මවද ඔහුගේ උදව්වට එකතු වූවාය.

මවත් පියාත් දෙදෙනාම එකතුව හැරීව වාරු කරගෙන නවාතැන කරා කැඳවාගෙන යන්නට වූහ.

අවසිහියෙන් මෙන් ගමන් කළ හැරී එකම වචනයක්වත් කතා නොකළේය. ඔහුගේ මුහුණ පුරාම රතු පැහැ පළු දමා තිබිණ.

"අපි මෙයාව ෆ්ලෝරස් රෝහලට ගෙනියමු."

නිවහනේදී මව පැවසුවාය.

ඔවුහු බුඩ් නිවින්ස්ගේ කාරයෙන් හැරීව රෝහලට ගෙන ගියහ.

රෝහලේදී හැරීගේ මවට ප්‍රතිකාර කළ වෛද්‍යවරයා හැරීව ද පරීක්ෂාකර බැලිය.

"මෙයා මොනවා හරි අපත්‍ය කෑමක් කාලා. ඒක විෂ වෙලා....... මොනවාද මෙයා අද කෑවේ.....?"

පරීක්ෂාකර බැලිමෙන් අනතුරුව වෛද්‍යවරයා විමසීය.

"දන්නෙ නැහැ. එයාට ඒ ගැන කියන්නට කතා කරන්නවත් බැහැ."

හැරීගේ පියා පැවසීය.

වෛද්‍යවරයා හැරීගේ දෙනෙත් වෙත නැඹුරු විය.

"හැරී....... ඔයා කැලේදී මොනවා හරි කෑවාද........?"

ඔහු ඇසීය.

"ඔව්" යන්න හැගවීමට මෙන් හැරී හිස ඉහළ පහළ



සෙලවිය.

"පළතුරක්ද.......?"

එයටද හැරී හිස සෙලවිය.

"ගෙඩි ජාතියක්ද........?"

එයට ද "ඔව්" යන්න හැගවෙන පරිදි හැරී හිස සෙලවිය.

හැරීගේ දෙමාපියන් වෙත හැරුණු වෛද්‍යවරයා හැරී අනුභව කර ඇත්තේ තෙල් සිඳ ගැනිමට පාවිච්චි කරන ගෙඩි වර්ගයක් බව පැවසීය.

"ඒවා කොහෙත්ම මිනිස්සු කෑමට ගන්නා ගෙඩි වර්ගයක් නෙවෙයි."

වෛද්‍යවරයා වැඩිදුරටත් පැවසීය.

අනතුරුව වෛද්‍යවරයා හැරීට ප්‍රතිකාර කරන්නට පටන් ගත්තේය.

ප්‍රතිකාර කිරීමෙන් පසු වෛද්‍යවරයා හැරීගේ දෙමාපියන් වෙත පැමිණියේය.

"දවස් දෙක තුනකින් පුතාට සනීප වේවි. ඊත් හෙට ඔහු ගමට එකතු කරගෙන යන්න ඕනනෙ. ඒ ගියාට කමක් නැහැ. එක්ක ගිය ගමන් එහෙදී ඔහුට බෙහෙත් අරගෙන දෙන්න."

වෛද්‍යවරයා පැවසීය.

"අපි හෙට උදෙන්ම එන්නම්."

එසේ කියා සමුගන්නට පෙර මව හැරීගේ නළල සිප ගත්තාය.

# 26

පසුවදා උදයේ හැරීගේ මවත් පියාත් රෝහලට පැමිණියහ.

හැරීව රෝද පුටුවක තබාගත් හෙදියක් එය තල්ලු කරගෙන හැරීගේ දෙමාපියන් අසලට ගෙනාවාය.

ඔවුන් සමඟ කතා කිරීමට උත්සාහ කළද හැරීගේ මුවෙන් වචන පිට නොවිණ. ඔහු පසුවූයේ මලානිකව නිද්‍රාගත ස්වරූපයෙනි.

"මම දැනුත් එයාට නිද්‍රාජනක බෙහෙතක් එන්නත් කළා. එය ගුවනින් යන මේ ගමනේදී ඔහුට පහසුවක් වේවි."

වෛද්‍යවරයා පැවසීය.

ජිවන්ස් ඔහුගේ කාරයෙන් හැරී සහ ඔහුගේ දෙමාපියන් ගුවන් තොටුපළ වෙත ගෙන ගොස් හැරලීය.

ගුවන්යානයෙන් ගමන් කරන අතරතුර හැරීට මඳ සනීප ගතියක් දැනිණ. ඔහු තම කලිසම් සාක්කුව අත ගා බැලීය. වල් කාරා බියත් වැනි පෙන්ඩනය සාක්කුව තුළ තිබෙන බව ඔහුගේ අතට දැනිණ.

ඔහුගේ අඳාණිත දිව... රිදුම් දෙන දෙනෙත සමගම ඔහුගේ මතකයට නැගුණේ වනාන්තරයේ ශාපයයි.

සිදුවූ සෑම ව්‍යසනයක්ම ශාපය නිසා සිදුවූණි යැයි හැරී සිතීය.



"මේ පෙන්ඩන් එක ආපසු තිබුණු තැනම තිබිල්ලා තිබ්බෙ නැතිනම් අපට හැතැක්ම දහස් ගණනක් දුර අහස් ගමනක් යන්න බැරි වෙයි."

දෙමාපියන් සමඟ එසේ කියන්නට හැරීට අවශ්‍ය විය.

එහෙත් ඔහුගේ මුවෙන් වචන ශබ්ද නැගෙන සේ පිටකළ නොහැකි විය.

# 27

ගුවන්යානය තදින් හැස්සෙනු හැරිට දැනිණ. හැරි හැකි වේගයෙන් දෙඅතින් දෙදනා තිස් අල්ලා ගත්තේය.

ගුවන්යානය එසේ හැස්සුණේ ගමන අවසන් කරමින් ගුවන් තොටුපලට සේන්දු වී ධාවන පථයට ගොඩබෑමට අවස්ථාවේදීය.

හැරි මෙතෙක් පපුව තුළ සිරකරගෙන සිටි දිගු සුස්ම පිට කළේය. අනතුරුව සාක්කුව අත ගා බැලීය. පෙන්ඩනය සාක්කුව තුළය.

නිවසට ගිය වහාම ඔහු පෙන්ඩනය තම රෙදි අල්මාරියේ රෙදි තොගයක් යටින් සුරැකිව තැබිය. එය අවුරුදු ගණනාවක් වුවද එසේ තිබුණාදෙන් යැයි ඔහු තීරණය කළේය.

එය ගැන මතක් වෙන සෑම අවස්ථාවකම හැරි සිතුවේ තමාට හැකි යම් දිනක එය ආපසු ගෙන ගොස් තිබූ තැනම තබන බවය.

............ සමාප්තයි! ............